# කතෝලික ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

### තුන් වන ශ්‍රේණිය

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

විද්‍යුත් තැපෑල : info @ nie.lk
වෙබ් අඩවිය : www.nie.lk

# කතෝලික ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

## තුන් වන ශ්‍රේණිය

(2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

විද්‍යුත් තැපැල : info @ nie.lk
වෙබ් අඩවිය : www.nie.lk

**කතෝලික ධර්මය**

**තුන්වන ශ්‍රේණිය**

**ගුරු මාර්ගෝපදේශය**

ප්‍රථම මුද්‍රණය 2018

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN .................

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info @ nie.lk

*මුද්‍රණය* :

# අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද, අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්වයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා වෙනත් පාර්ශ්වයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මත බැහැර කිරීමට ද, සුභාවිත තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද, මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේද හා පහසුකම් ද, අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂයමාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ සහ සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක් වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතා මෙන් ම පුරාතන උරුම ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කර ගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණ තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශය නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශවල ඉගෙනුම් ක්‍රමවේද, අකුරක් වත් වෙනස් නො කොට පිළිපැදිය යුත්තක් නම් නො වේ. විෂය නිර්දේශයෙහි තේමා සහ නිපුණතා සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලි ව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන, ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයා හට ද, දෙගුරුනට ද, භාවිත කළ හැකි ය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නො වන බව දැන ගුරු භවතුන් පෙළ පොත හා මාර්ගෝපදේශය යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයවල සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයකු වුව ද අපේක්ෂා කරන සාධන, විෂයය ඉගැන්වීමට මඟ පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමඟ ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැ යි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**ආචාර්ය, පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය,**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමතිය** :

**උපදේශකත්වය** : ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන ස්වාමීන් වහන්සේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය

ගරු කේ. එච්. එච්. පියල් ජානක ප්‍රනාන්දු පියතුමා
ජාතික අධ්‍යක්ෂ, ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය

ගරු එම්. ග්‍රෙගරි ලක්ෂ්මන් ප්‍රනාන්දු පියතුමා
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (කතෝලික ධර්මය) අධ්‍යාපන අමාත්‍යාංශය

එම්. ඒ. ජී. ඩබ්ලිව්. කුලරත්න මයා
අධ්‍යක්ෂ වැ.බ. (මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන)
ජාතික අධ්‍යාපන ආයතනය

**අනුමතිය** : ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය සම්බන්ධීකරණය** : සකුන්තලා රණසිංහ මිය,
සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය.

**ලේඛක මණ්ඩලය** :

**බාහිර සම්පත් දායකත්වය**

ගරු කේ. එච්. එච්. පියල් ජානක ප්‍රනාන්දු පියතුමා

ජාතික අධ්‍යක්ෂ, ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය

ගරු රංජි සෝල්දුරෙයි කන්‍යාසොයුරිය, ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය

ගරු මේරි ප්‍රියදර්ශනී පැව්දි සොයුරිය, ගුරු සේවය, සිරි කුරුස විද්‍යාලය, ගම්පහ

පී. ඩී. ෆිලීෂියා අයිරීන් මිය, ගුරු උපදේශිකා, කැලණිය අධ්‍යාපන කලාපය

කේ. ඩී. පී. කරුණානායක මිය, ගුරු සේවය, සිරි කුරුස විද්‍යාලයය, ගම්පහ

**භාෂා සංස්කරණය** : ශ්‍රීනාත් ගණේවත්ත මයා

**පරිගණක පිටු සැකසීම** : බී. ඒ. එන්. බටවල මිය

**විවිධ සහාය** : ඩබ්ලිව්. එච්. ටී. සිල්වා මයා
එස්. පී. ඒ. සරත් කුමාර මයා

# හැඳින්වීම

ජාතික අරමුණු ඉටු කර ගැනීම සඳහා පාදක වන මූලික නිපුණතා ඇසුරින් 'ආගම සහ ආචාර ධර්මවලට අදාළ නිපුණතා' දරුවන් තුළ ගොඩනැංවීම 'ආගම' විෂයයේ වගකීම වෙයි.

කුඩා දරුවකුගේ ළපටි මනසෙහි අලුත් යමක් රෝපණය කිරීම පහසු ය, එ සේ ම යහපත් චර්යාවලට සහ වත් පිළිවෙත්වලට කුඩා දරුවකු අනුගත කිරීම ද වඩා ඉක්මනින් කළ හැකි ය. කුඩා දරුවකු තුළ පවත්නා එම ගුණාංගවලට මනා ව ගැළපෙන සේ මෙහි විවිධ ක්‍රියාකාරකම් යෝජනා කර ඇත. විෂය අන්තර්ගතයට අනුකූල ව සිසු දරුවාට අදාළ නිපුණතාව ලබා දෙමින් ඉගෙනුම් පල සාක්ෂාත් කර ගැනීමට එම ක්‍රියාකාරකම් ඔබට මාර්ගෝපදේශයක් වනු ඇතැ යි අපේක්ෂා කෙරේ.

සමාජයක සාමය සහ සදාචාරය පවත්වා ගැනීමට සියලු ම ආගම්වලින් ලැබෙන දායකත්වය සුළුපටු නො වේ. තව ද, තමා හැම අයුරින් ම පෝෂණය කර ගුණාත්මක ජීවිතයක් ගත කිරීමට ශ්‍රම දායකත්වය සපයන මිනිස් සමාජයට කෘතවේදී වෙමින් පෙරළා අවංක සේවයක් කිරීමටත්, යහගුණවලින් හෙබි මනුෂ්‍යයකු ලෙස අභිමානයෙන් යුතු ව ජීවත් වීමටත්, ආගමකින් ලැබෙන පන්නරය අතිමහත් ය. එ පමණක් නො ව අප එකිනෙකා විශ්වාස කරන පරිදි මරණින් ඔබ්බෙහි දී ද යහපතක් උදා කර ගැනීම සඳහා ආගමික ඉගැන්වීම් අපට නිසැක ව ම පිහිට වෙයි.

දැහැමි සමාජයක් බිහි කිරීමේ උදාර කර්තව්‍යය ආරම්භ කළ යුත්තේ ප්‍රාථමික අවධියේ කුඩා දරුවා ගෙනි. ඒ මහගු කර්තව්‍යය භාර ගෙන සිටින භාග්‍යවන්ත වූ ගුරුභවතා ඔබ යි. ඒ සඳහා ඔබෙන් ලැබෙන දායකත්වය සහ කැප වීම මහත් සේ අගයමු.

**එම්. ඒ. ජී. ඩබ්ලිව්. කුලරත්න**
**අධ්‍යක්ෂ,**
**මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# ජාතික අරමුණු

i. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමඟිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැඟීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

ii. වෙනස් වන ලෝකයක අභියෝගවලට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

iii. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම සහ හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මත සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

iv. පුද්ගලයින් ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයවලට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

v. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

vi. පුද්ගලයා ගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්ය සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

vii. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවලට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

viii. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

### i. සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ හතරක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරැදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

**රූපක භාවිතය** : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රවල දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

### ii. පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගය
- චිත්තවේගී බුද්ධිය

### iii. පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරවලට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුම පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතාව, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යා, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදාය, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

**ජෛව පරිසරය** : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය, ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

**භෞතික පරිසරය** : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍යය, සුව පහසුව, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම් යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා

iv. **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

- ආර්ථික සංවර්ධනයට දායක වීම
- තම වෘත්තීය ලැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම
- හැකියාවලට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියා උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

v. **ආගම සහ ආචාර ධර්මවලට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවලට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අදාළ අගය උකහා ගැනීම හා ස්වීයකරණය

vi. **ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටා තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

vii. **ඉගෙනීමට ඉගෙනුම පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස් වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත්, ස්වාධීන ව ඉගෙන ගැනීමත්, සඳහා පුද්ගලයින්ට ශක්තිය ලබා දීම

# ප්‍රාථමික විෂයමාලා සැලැස්ම

**ජාතික පොදු නිපුණතා**

- සන්නිවේදන නිපුණතා
- පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා
- පරිසරයට අදාළ නිපුණතා
- වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා
- ආගම හා ආචාර ධර්මවලට අදාළ නිපුණතා
- ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා
- 'ඉගෙනීමට ඉගෙනුම' පිළිබඳ නිපුණතා

**දරුවන් හැඳින ගැනීම**

## 1 ප්‍රධාන අවධිය

1 ශ්‍රේණිය | 2 ශ්‍රේණිය

- මව්බස
- දෙවන ජාතික භාෂාව
- ගණිතය
- ආගම
- ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි
- පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්
- විෂය සමගාමී ක්‍රියාකාරකම්

**1 ප්‍රධාන අවධියට අදාළ අත්‍යවශ්‍ය නිපුණතා පිළිබඳ ප්‍රවීණතාව තහවුරු කිරීම**

## 2 ප්‍රධාන අවධිය

3 ශ්‍රේණිය | 4 ශ්‍රේණිය

- මව්බස
- ඉංග්‍රීසි
- දෙවන ජාතික භාෂාව
- ගණිතය
- ආගම
- ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි
- පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්
- විෂය සමගාමී ක්‍රියාකාරකම්

**2 ප්‍රධාන අවධියට අදාළ අත්‍යවශ්‍ය නිපුණතා පිළිබඳ ප්‍රවීණතාව තහවුරු කිරීම**

## 3 ප්‍රධාන අවධිය

5 ශ්‍රේණිය

- මව්බස
- ඉංග්‍රීසි
- දෙවන ජාතික භාෂාව
- ගණිතය
- ආගම
- ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි
- පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්
- සිසු ලැදියා හා රුචිකත්ව සඳහා වන වෛකල්ප විෂයයන්
- විෂය සමගාමී ක්‍රියාකාරකම්

**3 ප්‍රධාන අවධියට අදාළ අත්‍යවශ්‍ය නිපුණතා පිළිබඳ ප්‍රවීණතාව තහවුරු කිරීම**



# කාලය බෙදා ගැනීම

## දෙ වන ප්‍රධාන අවධිය (තුන් වන සහ හතර වන ශ්‍රේණි)

| විෂයය | | සතියකට වෙන් කර ඇති කාලය |
|---|---|---|
| 1. | මවු බස | පැය 5.00 |
| 2. | ගණිතය | පැය 5.00 |
| 3. | පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් | පැය 6.00 |
| 4. | ඉංග්‍රීසි | පැය 3.00 |
| 5. | දෙවන ජාතික භාෂාව | පැය 1.00 |
| 6. | ආගම | පැය 2.00 |
| 7. | උදය රැස්වීම සහ ආගමික වතාවත් | පැය 1.15 |
| 8. | විවේක කාලය | පැය 1.40 |
| 9. | ශරීර සුවතා ක්‍රියාකාරකම් | පැය 2.05 |
| 10. | විෂය සමගාමී ක්‍රියාකාරකම | මිනිත්තු 30 (සතියේ එක් දිනෙක) |
| | **සතියක මුළු කාලය** | පැය **27.30** |

# කතෝලික ධර්මය ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාවෙන් දැක්වෙන ජාතික අරමුණු මෙම ශ්‍රේණියේ විෂය නිර්දේශ සැකසීම සඳහා පාදක කොට ගෙන ඇත. ජාතික පොදු අරමුණු කරා ළඟාවීම පිණිස මූලික වන පොදු නිපුණතා ද එම වාර්තාවේ යෝජනා කර තිබේ.

මෙම නිපුණතා අතර ආගමයට හා ආචාර ධර්මවලට අදාළ නිපුණතා දරුවන් තුළ ඇති කරන ප්‍රධාන විෂයය කතෝලික ධර්මය යි. අනෙක් නිපුණතා ද දරුවන් තුළ ඇති කිරීමට කතෝලික ධර්මය විෂයයට උසස් මෙහෙයක් කළ හැකි ය. මේ අනුව අනාගත සංවර්ධනය නමැති ව්‍යූහය ගොඩ නැඟීම සඳහා කතෝලික ධර්මයට ලබා දිය හැකි දායකත්වය අතිවිශාල ය.

ප්‍රාථමික ශ්‍රේණිවල කතෝලික ධර්මය විෂය නිර්දේශ සැකසීමේ දී අදාළ ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන්ගේ වයස් මට්ටම, පරිණතිය, භාෂා හැකියා, රුචිකත්ව හා ළැදියා කෙරෙහි සැලැකිලිමත් වී තිබේ. ඒ අනුව එම දරුවන්ට ළඟා විය හැකි නිපුණතා හා ඒ සම්බන්ධ විෂය කරුණුවලට පමණක් සීමා වී මෙම විෂය නිර්දේශ පිළියෙළ කිරීමට උත්සාහ ගෙන ඇත. එ සේ ම උගත් දේ ප්‍රායෝගික ජීවිතයේ දී අත්දැකින්නට ද, ක්‍රියාකාරකම් මඟින් ඉඩ සලසා ඇත.

විෂය කරුණු ඉගෙන ගැනීම පමණක් නොව දේව අභිමතයට අවනත වෙමින්, දෙවි පියාණන්, ශුද්ධ බයිබලය, සාන්තුවරයන්ගේ චරිත, අවට සිටින අය, අවට පරිසරය සහ තමා අතර අන්තර් සබඳතා ගොඩනගා ගැනීම සඳහා කතෝලික බැතිමතකු තුළ තිබිය යුතු නිපුණතා ස්ථිර සාර ලෙස ඇති කිරීම ද මෙම විෂයයේ ප්‍රමුඛ අරමුණකි.

කුඩා ශිෂ්‍යයකුට කතෝලික ධර්මය ඉගැන්වීම දැඩි වගකීමක් සහිත ව කළ යුත්තකි. කුඩා අවදියේ ඉතා සුළු වූ හෝ කරුණක් සම්බන්ධයෙන් වැරැදි වැටැහීමක් ඇති වුව හොත් එය එම ශිෂ්‍යයාගේ මෙ ලොව ජීවිතයට පමණක් නො ව සදාතන ජීවිතයට ද බලපෑමට ඉඩ ඇත. එ බැවින් නො දන්නා හෝ සැකමුසු හෝ කරුණු ඇතොත් ඒ සියල්ල මැනැවින් දැන ගෙන නිවැරැදි දේ ම ඉදිරිපත් කිරීමට සියලු ගුරුවරුන් අනතිමාන විය යුතුවාක් මෙන් ම අවංක ද විය යුතු ය.

ශිෂ්‍යයන්ගේ ජීවිතවලට ආදර්ශයක් වන පරිදි තමා ද යහපත් ජීවන පැවැත්මෙන් යුතු වෙමින් මෙම විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීම ගුරුවරුන් ගේ වගකීම යි.

එක ම ගුරුවරයකු විසින් නම්‍ය කාල සටහනක් ක්‍රියාත්මක කිරීමෙන් දරුවන්ට වඩාත් හිතකර ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර ගත හැකි ය.

**ප්‍රාථමික අවධිය සඳහා වන නිපුණතා**

1. දෙවි පියාණන් වහන්සේගේ ආදරය මැවිල්ල ඇසුරෙන් අත් දකියි, තුති පුදයි, ප්‍රතිප්‍රේමය දක්වයි.
2. දෙවි පියාණන් වහන්සේ සමඟ කතා කරයි.
3. දෙවි පියාණන් වහන්සේගේ ම දරුවකු බවට පත් වෙයි.
4. ජේසුස් වහන්සේගේ සුවිශේෂ ගුණාංග නම් කරයි.
5. සාන්තුවරයන්ගේ චරිත හා ශුද්ධ බයිබලය හඳුනා ගනියි.

1 - 5 ශ්‍රේණි තෙක් ප්‍රාථමික අවධියේ කතෝලික ධර්මය පිළිබඳ ඉගෙනුම් අත්දැකීම් ලබන සිසුන්, ප්‍රාථමික අවධිය අවසාන කරන විට උක්ත නිපුණතාවලට ළඟා වනු ඇතැ යි අපේක්ෂා කෙරේ. ඒ සඳහා අදාළ විෂය අන්තර්ගතය, විෂය නිර්දේශවල දක්වනු ලබන අතර ඊට අදාළ ව ක්‍රියාකාරකම් පාදක ප්‍රවේශයකින් කටයුතු කිරීම සඳහා යෝජනා කර ඇති ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය වඩාත් නිර්මාණශීලී ව භාවිත කරනු ඇතැ යි අපේක්ෂා කෙරේ. ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් අත්දැකීම් ලබාගැනීමේ දී ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාරකයක් ලෙස පමණක් පෙළ පොත යොදා ගැනීම සුදුසු ය.

## ඉගැන්වීමේ ක්‍රමෝපාය

ප්‍රාථමික ශ්‍රේණිවල කතෝලික ධර්මය ඉගැන්වීමේ දී ශිෂ්‍යයන් ප්‍රිය කරන ආගමික ජීවිතය හා සමීප ක්‍රියාකාරකම් බහුල ලෙස යොදා ගත යුතු වේ. වන්දනාව, ආගමික චාරිකා, දේව මන්දිර නැරඹීම, වත්පිළිවෙත් මේ අතර ප්‍රධාන තැනක් ගනියි.

තව ද බයිබල් කතා, සාන්තුවර චරිත කතා, සභා ඉතිහාසය හා සම්බන්ධ කතා දෘශ්‍යාධාර සමඟ රසවත් ව ඉදිරිපත් කළ යුතු ය. මේ හා සම්බන්ධ ගායනා, රංගන, චිත්‍ර ඇඳීම වැනි සෞන්දර්ය මුසු ක්‍රියාකාරකම්වල දරුවන් නිරත කරවීමට ද නිරන්තරයෙන් අවධානය යොමු කළ යුතු වෙයි. එය ශිෂ්‍යයාට වින්දනයක් ගෙන දෙන ලෙස ඉතා ම සුන්දර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක් බැවින් එම ක්‍රමවේද සියල්ලෙන් කතෝලික ධර්මය ඉගෙනීමට දැඩි ආශාවක් දරුවන් තුළ ඇති වනු ඇත. එ මෙන් ම ශිෂ්‍යයා ක්‍රමයෙන් ජේසුස් වහන්සේ වෙතට සමීප කිරීමක් ද සිදු වේ.

## පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන්

පාසල් සංස්කෘතිය හා සම්බන්ධ වැඩසටහන්වලින් කතෝලික ධර්මය විෂය සම්බන්ධ බොහෝ නිපුණතා ආවරණය කළ හැකි ය. එසේ ම තහවුරු කළ හැකි ය. තව ද පාසල් සංස්කෘතියෙහි දී මෙම නිපුණතා ගොඩනැගෙන නව අංග ඇති කිරීම කෙරෙහි ද විදුහල්පතිවරුන්ගේ සුවිශේෂ අවධානය යොමු කිරීම අපේක්ෂා කෙරේ.

ප්‍රාථමික පාසල සඳහා ක්‍රියාත්මක වන උදය ආගමික වැඩසටහන් මේ අතර ප්‍රධාන තැනක් ගනියි. පළමු වන ශ්‍රේණියේ දී ඉතා සරල ව අරඹා පස් වන ශ්‍රේණිය තෙක් මෙම වැඩසටහන ක්‍රමයෙන් දියුණු කරමින් විවිධ අංග එක් කළ හැකි ය.

පාසල අයිති මීසම භාර පියතුමා හෝ ළඟ ම පිහිටි දෙව් මැඳුරක නැතහොත් ආයතනයක පියතුමා හෝ හමුවීමට සිසුන්ට අවස්ථාව සලසා දීම සුදුසු ය. එ සේ ම වාරයකට අවම වශයෙන් දෙ වතාවක් වත් දෙව් මැඳුරට ළමයින් රැගෙන යාමෙන් දෙවි පියාණන් වහන්සේ ගේ ආදර පහස විඳීමට ඔවුන්ට අවස්ථාව සැලසේ.

පවිත්‍රතාව, විනීත බව, සහයෝගය, ගුරුවරුන් කෙරෙහි පැවැත්විය යුතු ආචාර ධර්ම, ආශීර්වාද ඇසුරෙන් ගොඩ නැගෙන සමානාත්මතාව, සුහදතාව, සහයෝගය ආදි ලක්ෂණවලින් පාසල් පරිසරය හා සම්බන්ධ සංස්කෘතිය අලංකාර කෙරේ. ඉහත සංස්කෘතියෙහි දී කතෝලික ධර්මය විෂයයෙන් අපේක්ෂිත නිපුණතා වර්ධනය වන අවස්ථා උදා කළ හැකි ය. මෙ මගින් විෂයයේ ඉගෙන ගන්නා සියල්ල ප්‍රායෝගික භාවිතයට ද අවස්ථා උදා වේ.

## තක්සේරු කිරීම

ප්‍රාථමික ශ්‍රේණිවල දී ලිඛිත පරීක්ෂණ වැනි ඇගයීම්වලට වඩා ප්‍රමුඛත්වය දිය යුතු වන්නේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරු කර ගත් ඇගයීම්වලට ය. නිරීක්ෂණය, ගවේෂණය, ක්ෂේත්‍ර චාරිකා, අභිනය, නාට්‍ය, රූකඩ, සාකච්ඡා, වාචික ප්‍රශ්න වැනි ඇගයීම් මේ සඳහා උචිත වෙයි.

**ව්‍යාපෘති නායක**

# පටුන

පිටුව


| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය | iv |
| විෂයමාලා කමිටුව | v |
| හැඳින්වීම | vi |
| ජාතික අරමුණු | vii |
| මූලික නිපුණතා | viii - ix |
| විෂයමාලා සැලැස්ම | x |
| කාලය බෙදා ගැනීම | xi |
| කතෝලික ධර්මය ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් | xii - xiii |
| පටුන | xiv |
| විෂය නිර්දේශය හා ඉගෙනුම් සැලැස්ම | xv |
| ඉගෙනුම් - ඉගැන්වීම ක්‍රියාවලිය | 1 |

# විෂය නිර්දේශය

# හා

# ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා

# උපදෙස්

## විෂය අරමුණු

1. සමාජයේ ගෞරවාදරයට බඳුන් වන සැදැහැවත් කිතුනු දරුවකු බිහි කිරීම
2. කිතුනු ප්‍රතිපත්ති අනුගමනය කරන ජීවන දර්ශනයක් ගොඩනංවා දීම
3. ශුද්ධ බයිබලය යනු දේව වචනය බවට දැනුම්වත් කරමින් ශුද්ධ බයිබලයට අනුකූල ව ජීවත් වීමට දිරි ගැන්වීම
4. දෙවි පියාණන් වහන්සේ සමඟ ආත්මීය සබඳතා ගොඩනඟා ගැනීමට පුරුදු පුහුණු කිරීම
5. මරියතුමිය ගේ සහ සාන්තුවරයන්ගේ චරිතවලින් ආදර්ශ ලබා දීම
6. දේව තිළිණයක් වූ පරිසරය ආරක්ෂා වන සේ ද, සකසුරුවම් ලෙස ද, පරිහරණය කරමින් තව දුරටත් සංවර්ධනය කර ගැනීමේ ආකල්ප ජනිත කිරීම
7. ස්වභාව ධර්මයෙන් හා තමා අවට ජීවත් වන අය මඟින් දේව ආදරය අත් විඳීමට සහ ප්‍රතිප්‍රේමය දැක්වීමට අවස්ථා සම්පාදනය කිරීම
8. සියල්ලන්ට ම ප්‍රේම කරමින් කණ්ඩායමක් තුළ එකමුතු ව සමඟියෙන් කටයුතු කිරීමේ කුසලතා රෝපණය කිරීම
9. අන්‍යාගම්වලට ද ගරු කරමින් සහයෝගිතාවෙන් යුතු ව ජීවත් වීමේ මැදහත් ගුණාංග වර්ධනය කිරීම
10. ශ්‍රී ලංකාවේ කතෝලික සභාවේ වගකීම් සහ කාර්යභාරය පිළිබඳ අවබෝධයක් ලබා දීම

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| 1.0 මහෝත්තම දෙවි පියාණන් වහන්සේට ආදරය කිරීම | 1.0 මහෝත්තම දෙවි පියාණන් වහන්සේගේ ආදරය මැවිල්ල මඟින් අත්දකියි. තුති පුදයි. ප්‍රතිප්‍රේමය දක්වයි. | 1.1 නව වසරට තුති පුදයි. |
| | | 1.2 මවන ලද ලස්සණ ලෝකය මඟින් |
| | | 1.3 උතුම් ම මැවිල්ල වන මිනිසා මඟින් |
| | | 1.4 පාපයට වැටුණු මිනිසාට සමාව දීම මඟින් |
| | | 1.5 අවනත භාවය සහ සහයෝගය දැක්වීම<br>• නිවසේ දී<br>• ගමේ දී/නගරයේ දී<br>• පාසලේ දී<br>• දහම් පාසලේ දී |
| | | 1.6 මිතුදම් ගොඩනගා ගැනීමෙන්<br>• අසල්වැසියන් සමඟ<br>• පන්තියේ ළමයින් සමඟ |
| | | 1.7 කරුණාව හා දයාව දැක්වීම මඟින්<br>• රෝගීන්ට හා විශේෂ අවශ්‍යතා ඇති අයට<br>• අසරණ හා අනාථ අයට<br>• ළදරු හා මහලු අයට<br>• සතුන්ට හා ගස්වැල්වලට |
| | | 1.8 පරිසර පවිත්‍රතාව මඟින්<br>• නිවස හා අවට<br>• පාසල හා පන්ති කාමරය අවට<br>• දෙව්මැඳුර හා අවට<br>• පොදු ස්ථාන |
| 2.0 මහෝත්තම දෙවි පියාණන් වහන්සේ සමඟ කතා කිරීම | 2.0 මහෝත්තම දෙවි පියාණන් වහන්සේ සමඟ කතා කරයි. | 2.1 විවිධ අවස්ථාවන්හි දී<br>• නිවසේ දී<br>• අවදි වූ විට නින්දට යාමට පෙර<br>• පාඩම් කිරීමට පෙර හා පසු<br>• කෑමට පෙර හා පසු<br>• ආගම පාඩම පටන් ගැනීමට පෙර හා පසු<br>• පවුල් ජපමාලය<br>• ගමන් යාමට පෙර හා පසු |
| | | 2.2 චතාරික කාලයේ දී පාද නමස්කාරය |
| | | 2.3 දේවස්ථානයේ දී දිව්‍ය පූජාව (විශේෂයෙන් ඉරුදින හා ණය මංගල්‍යය දින) |
| | | 2.4 පොදු යැදුම්<br>• ස්වාමිවාක් ආරාධනාව<br>• ත්‍රිත්ව ස්තෝත්‍රය |

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| **3.0 මහෝත්තම දෙවි පියාණන් වහන්සේගේම දරුවකු වීම.** | 3.0 මහෝත්තම දෙවි පියාණන් වහන්සේගේ ම දරුවකු බවට පත් වෙයි. | 3.1 ජේසුස් වහන්සේගේ ළමා කාලය<br>• දොළොස් වියේ දී දේව මන්දිරයේ දී පඬිවරුන් හා සාකච්ඡා කිරීමේ සිද්ධිය මඟින්<br>• මරියතුමිය හා ජුසේතුහමා සමඟ අත්දැකීම් බෙදා ගැනීම සහ කීකරු වීම මඟින් |
| | | 3.2 ජේසුස් වහන්සේගේ දූත මෙහෙවර<br>• ජෝර්දාන් ගඟ අසබඩ දී බෞතීස්ම ස්නාපනය ලැබීමේ සිද්ධිය මඟින්<br>• පාළුකරයේ සිද්ධිය මඟින්<br>• ගෝලයන් කැඳවීමේ සිද්ධිය මඟින්<br>• කුඩා දරුවන්ට දැක්වූ ආදරය මඟින් |
| **4.0 උත්තරීතර ජේසුස් වහන්සේගේ සුවිශේෂ ගුණාංග** | 4.0 උත්තරීතර ජේසුස් වහන්සේගේ සුවිශේෂ ගුණාංග නම් කරයි. | 4.1 පරිත්‍යාගශීලී ව සමාජයට සේවය කරන අය මඟින්<br>• ආබාධිත නිවාසවල (විශේෂ අවශ්‍යතා ඇති)<br>• සරණාගතයන්<br>• රෝහල්වල<br>• ළමා හා වැඩිහිටි නිවාසවල |
| | | 4.2 අසරණ අය හා දිවි කැප කළ අය<br>• ගරු මයිකල් රුද්‍රිගු පියතුමා (සිංහල)<br>• ආගම හා භාෂාව වෙනුවෙන් සේවය කළ ගරු අදිරියාන් ජෝශප් පියතුමා (දමිළ) |
| **5.0 ශුද්ධ බයිබලය හා සාන්තුවරයන්ගේ චරිත** | 5.0 ශුද්ධ බයිබලය හා සාන්තුවරයන්ගේ චරිත හඳුනාගනියි. | 5.1 ශුද්ධ බයිබලයේ චරිත<br>• ආබ්‍රහම් , ජාකොබ්, ජෝශප් |
| | | 5.2 සාන්තුවරයන්ගේ චරිත<br>• ශු. තෙරේසා මවුතුමිය<br>• ශු. තාර්සිසියුස් තුමා |

## 1.0 තේමාව : මහෝත්තම දෙව් පියාණන් වහන්සේට ආදරය කිරීම

**නිපුණතාව :** මහෝත්තම දෙව් පියාණන්ගේ ආදරය, මැවිල්ල මඟින් අත් දකියි. තුති පුදයි, ප්‍රතිප්‍රේමය දක්වයි.

**ඉගෙනුම් පල :** 1.1

- තමාට ලැබුණු නව පන්තිය, ගුරුතුමිය, මිතුරු-මිතුරියන් සහ අලුත් පොත්පත් සඳහා දෙව් පියාණන්ට තුති පුදයි.
- පන්ති භාර ගුරුතුමියට, ආගමය උගන්වන ගුරුතුමියට නිර්මාණය කරන ලද සුබ පැතුම් පතක් දී සුබ අලුත් අවුරුද්දක් ප්‍රාර්ථනා කරයි..

**ඉගෙනුම් සම්පත් :**

- කිතුනු ගී පොත
- ගීතිකාව අඩංගු අත් පත්‍රිකා
- නව වසරට ලද පොත් පත්
- පසුගිය වසරේ හොඳින් භාවිත කළ පොත්
- සුබ පැතුම් පතක් නිර්මාණයට අවශ්‍ය ද්‍රව්‍ය

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- පන්තියේ සියලු ම සිසුන්ට බුලත් කොළයක හැඩැති ගීතිකාව අඩංගු නිර්මාණය කරන ලද අත් පත්‍රිකාව බෙදා දෙන්න. (කිතුනු ගී 251)
- මෙම ගීතිකාව අංග චලනයෙන් යුතු ව ගායනා කිරීමට සිසුන් යොමු කරන්න.

**සිහිල් සුළං**

පුන ගැයුම

සිහිල් සුළං රළි පාවෙන්නේ
කුරුලු හඬින් ගීත ඇසෙන්නේ
තුරු මත මල් කැකුළු දිලෙන්නේ
උදා ගිරෙන් හිරු පායන්නේ

සතුටු සිනාවෙන් මුව සරසාලා
සුහද කතාවෙන් සිත් සනසාලා
දවස හොඳින් ගත කරන්න
සැමට ම සුබ සෙත සදන්න
අපට සරණ වන්නැ දෙව්ඳුනේ //

සැමට දයාවෙන් අතහිත දීලා
මෙත් කරුණාවෙන් සැනසෙන ලීලා
නිරතුරු අප කල් ගෙවන්න
රට දියුණුව ඇති කරන්න
අපට සරණ වන්නැ දෙව්ඳුනේ //

ඉගෙන ගැනීමෙන් නුවණ වඩාලා
ගුණමිණි බරණින් හැඩ වැඩ වීලා
ඉදිරියට ම පිය නඟන්න
අනාගතය සරු කරන්න
අපට සරණ වන්නැ දෙව්ඳුනේ //

පියවර 2 : • නව වසරේ ලැබුණු අලුත් පන්තිය, අලුත් ගුරුතුමිය, අලුත් පොත්පත් සහ අලුතෙන් ලැබුණ වෙනත් දේ පිළිබඳ ව කරුණු විමසමින් සිසුන් සමඟ සංවාදයක යෙදෙන්න.

• සිසුන් ගෙන් ලබාගත් තොරතුරු අභ්‍යාස පොතේ ක්‍රමානුකූල ව සටහන් කරවන්න.

• මේ සියලු ම දේ ලබා දුන් මහෝත්තම දෙවි පියාණන් වහන්සේට බැතියෙන් තුති පිදීමට අවස්ථාවක් සම්පාදනය කරන්න.

• සිසුන් හට ලැබුණු ගීතිකාව අඩංගු නිර්මාණාත්මක පත්‍රිකාව අභ්‍යාස පොතේ අලවා ගැනීමට සලස්වන්න.

පියවර 3 : • පෙර දැනුම් දුන් පරිදි සිසුන් සුබ පැතුම් පත නිර්මාණයට රැගෙන එන ද්‍රව්‍ය අනුව කණ්ඩායම් කරවන්න.

• සුබ පැතුම් පත නිර්මාණය කිරීමට අවශ්‍ය උපදෙස් සිසුන් හට පැහැදිලි ව ඉදිරිපත් කරන්න.

• සාදන ලද සුබ පැතුම් පත් ගුරුවරුන් හට ලබා දී නව වසරට දේවාශිර්වාදය ප්‍රාර්ථනා කිරීමට යොමු කරවන්න.

පියවර 4 : • පසුගිය වසර දෙක තුළ හොඳින් භාවිත කළ පොත් කිහිපයක් සිසුන් හට ප්‍රදර්ශනය කරන්න.

• එම පොත් සකසුරුවම් සහිත ව භාවිත කිරීම පිළිබඳ ව සිසුන් අගය කරන්න.

• නව වසරේ ලැබුණු සියලු දේ සකසුරුවම් සහිත ව භාවිත කිරීමට අවශ්‍ය වරම් ඉල්ලා යාච්ඤා කරන්න.

**තක්සේරුව :**

- නව වසරේ ලද සියලු දේ ලස්සණට, පිරිසිදු ව තබා ගැනීමට කළ යුතු දේ ප්‍රකාශ කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- නව වසර තුළ භෞතික ව, ආධ්‍යාත්මික ව තමන් ලද සියලුම දේට කෘතඥ වෙමින් දෙවි පියාණන් වහන්සේට තුති පිදීම

## 1.0 තේමාව : මහෝත්තම දෙවි පියාණන් වහන්සේට ආදරය කිරීම

**නිපුණතාව** : **මහෝත්තම දෙවි පියාණන්ගේ ආදරය, මැවිල්ල මඟින් අත් දකියි. තුති පුදයි, ප්‍රතිප්‍රේමය දක්වයි.**

**ඉගෙනුම් පල** : 1.2

- ලෝකය ලස්සණ වීමට දෙවි පියාණන් වහන්සේ මවා ඇති දේවල් නම් කරයි.
- දෙවි පියාණන් වහන්සේ විසින් මවන ලද මැවිල්ලේ සාකච්ඡා කරමින්, මැවිල්ල නිසි ලෙස ප්‍රයෝජනයට ගත හැකි අයුරු ලියා දක්වයි.
- දෙවි පියාණන් විසින් මවන ලද ලෝකයට තුති දෙමින් එය ආරක්ෂා කිරීමට කළ හැකි දේවල් ලැයිස්තු ගත කරයි.
- අවට පරිසරයෙන් ලබාගත් ස්වභාවික දේ ඇසුරින් නව නිර්මාණයක් කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- කිතුනු ගී පොත
- ස්වභාව ධර්මයේ අසිරිය පෙන්වන චිත්‍රයක් අඩංගු පෝස්ටරයක්
- දෙවි පියාණන්ගේ මැවිල්ල ප්‍රයෝජනයට ගෙන ඇති කර්මාන්ත පෙන්වන සංයුක්ත තැටියක්
- ස්වභාව ධර්මයේ දේවලින් සාදන ලද මැටි බඳුනක්, කොස්ස, ඉදල, පුටුව වැනි භාණ්ඩ
- අවට පරිසරයේ ස්වභාව ධර්මයෙන් ලබා ගත් ද්‍රව්‍ය

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- පහත ගීතිකාවට බැතියෙන් හා අවබෝධයෙන් යුතු ව සවන් දීමට සිසුන් යොමු කරවන්න. (කිතුනු ගී 22)

ගයමු වයමු සමිඳු පසසලා - සවන පිනන තාල සදාලා
සමිඳු වඳිමු සැවොම එක්වෙලා - අරුත් සපිරි වදන් ගොතාලා

හිරුට එළිය දුන්නෙ කවුරු දෝ ? (කවුරු දෝ)
සඳුගෙ සිසිල ලැබුණෙ කොහෙන් දෝ (කොහෙන් දෝ)
දහසක් තරු මැව්වෙ කවුරු දෝ ? (කවුරු දෝ)
මිනිස් ලොව ද තැනූ දෙවිඳුනේ

දේදුන්නෙ පාට ගෑවෙ කවුරු දෝ ? (කවුරු දෝ)
මලට සුවඳ හැමුවෙ කොහෙන් දෝ ? (කොහෙන් දෝ)
කුරුලු ගීත ගෙතුවෙ කවුරු දෝ ? (කවුරු දෝ)
සොබා දහම මැව්ව දෙවිඳුනේ

කඳු ද හෙල් ද මැව්වෙ කවුරු දෝ ? (කවුරු දෝ)
දි'යැලි ගඟ සොයන්නෙ කවුරු දෝ ? (කවුරු දෝ)
පිපුන නෙළුම සෙව්වෙ කවුරු දෝ ? (කවුරු දෝ)
සැවොම එක් ව වඳින දෙවිඳුනේ

- සවන් දුන් ගීතිකාව සිසුන් සමඟ ගායනා කරන්න.
- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු වාචික ව ලබා ගන්න.

1. හිරුට එළිය දුන්නේ කවරෙක් ද ?
2. දේදුන්නේ පාට ගෑවේ කවරෙක් ද ?
3. කඳුහෙල් මැව්වෙ කවුරුන් ද ?

පියවර 2 : • ස්වභාව ධර්මයේ අසිරිය අඩංගු පෝස්ටරය ප්‍රදර්ශනය කරන්න.
- එහි අඩංගු වන මැවිල්ල පිළිබඳ ව නිර්මාණාත්මක වැකි ප්‍රකාශ කිරීමට යොමු කරවන්න.
- ඒ ඇසුරින් මහෝත්තම දෙවි පියාණන් වහන්සේගේ මැවිල්ලේ අපූර්වත්වය සිසුන්ට අවබෝධ කරවන්න.
- මෙය අපහට දෙවිඳුන් ලබාදුන් මහඟු තිළිණයක් බව ඒත්තු ගන්වන්න.

පියවර 3 : • සූදානම් කරගත් භාණ්ඩ (මැටි බඳුන, කොස්ස, පුටුව වැනි) සිසුන්ට ඉදිරිපත් කරන්න. මෙම භාණ්ඩ නිපදවීමට යොදා ගෙන ඇති මැවිල්ල පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- සිසුන්ගේ පිළිතුරු අගයමින් පහත සඳහන් කරුණු පහදන්න.

  * කොස් ගස - බත් ගස ලෙස හඳුන්වන බව
  * පොල් ගස - සෑම කොටසක් ම ප්‍රයෝජනවත් බව
  * මැටි - ශ්‍රමය, බුද්ධිය යොදා ප්‍රයෝජනවත් දේ සෑදීම
  * ජලය - සම්පතක් බව හා ජල විදුලිය නිපදවීම

පියවර 4 : • යෝජනා කරගත් පරිදි ස්වාභාවික ද්‍රව්‍ය යොදා ගනිමින් තම නිවසට/පාසලට ප්‍රයෝජනවත් භාණ්ඩයක් නිර්මාණය කරන්න. (*උදා* : බිත්ති සැරසිල්ලක්, මල් බඳුනක්, දූවිලි පිස්නයක් වැනි)

පියවර 5 : • පන්තියේ සියලුම සිසුන් සමඟ පෙළ පොතේ අඩංගු ගීතය ගායනා කරන්න.

**තක්සේරුව :**

- මහෝත්තම දෙවි පියාණන් වහන්සේගේ මැවිල්ල ආරක්ෂා කිරීමට පුංචි ඔබට කළ හැකි දේවල් ලැයිස්තු ගත කරන්න.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- ස්වභාව ධර්මයේ සුන්දරත්වය අගයමින් එයින් ප්‍රයෝජන ලබා ගනී.

## 1.0 තේමාව : මහෝත්තම දෙවි පියාණන් වහන්සේට ආදරය කිරීම

**නිපුණතාව** : **මහෝත්තම දෙවි පියාණන්ගේ ආදරය, මැවිල්ල මඟින් අත් දකියි. තුති පුදයි, ප්‍රතිප්‍රේමය දක්වයි.**

**ඉගෙනුම් පල** : 1.3

- දෙවි පියාණන් වහන්සේගේ මැවිලි අතුරින් උතුම් ම මැවිල්ල මිනිසා බව ප්‍රකාශ කරයි.
- උතුම් ම මැවිල්ල වන මිනිසා මඟින් සතුන්ට තබන ලද නම් ලියා දක්වයි.
- දේව සමානකමට මවන ලද මිනිසා වෙනුවෙන් දෙවි පියාණන් වහන්සේට ප්‍රතිප්‍රේමය දක්වමින් ගීතිකාවක් ගායනා කර යාච්ඤා කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- ශුද්ධ බයිබලය
- සතුන්ගේ නම් ලියූ පුවරු
- සතුන්ගේ මුහුණු සහිත වෙස් මුහුණු
- කිතුනු ගී පොත
- ආදි මවුපියන්ගේ ඇඳුම්
- $A_4$ කඩදාසි

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- පෙර සූදානම් කරගත් පරිදි ශුද්ධ බයිබලය ගෞරවාන්විත ව තබන්න.
- ශුද්ධ බයිබලයේ උප්පත්ති පොතේ 1 : 27 සිසුන් ඉදිරියේ ගෞරවාන්විත ව කියවන්න.

> දෙවියන් වහන්සේ
> තම ස්වරූපය අනුව
> මිනිසා මැවූ සේක.
>
> දෙවියන් වහන්සේගේ ම
> ස්වරූපය අනුව
> ඔවුන් මවා වදාළ සේක.
>
> පුරුෂයා ද ස්ත්‍රිය ද වශයෙන්
> ඔවුන් මැවූ සේක.

- සවන් දුන් දේව වචනය පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

පියවර 2 :

- පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකකට බෙදන්න.
- එක් කණ්ඩායමකට සතුන්ගේ නාම පුවරු ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම එම සතුන් නිරූපණය වන පරිදි මුහුණු (නැතිනම් ඇඳුම් පැලඳුම්) පැලඳ ගැනීමට යොමු කරන්න.
- දෙවියන් වහන්සේගේ හඬ ප්‍රකාශ කළ හැකි සිසුවකු හා ආදි මවුපියන්ගේ චරිත රඟ දැක්වීමට සුදුසු දරුවන් දෙදෙනෙකු තෝරා ගන්න.
- දෙව් හඬ අවදි කරමින් ආදි මවුපියන්, සතුන්ට නම් තැබීමේ සිද්ධිය රඟ දක්වන්න.

පියවර 3 : • පහත සඳහන් ගීතිකාව අවබෝධයෙන් යුතු ව ගායනා කරන්න. (කිතුනු ගී - 100)

ජීවිතේ මට දුන්නු දෙවි තුමනේ
මගේ පණ නල ඔබ අතේ රඳුණේ
රැක ගන්න සමිඳුනි මා
රැක ගන්න සමිඳුනි මා

සතුරු අනතුරු මා වටේ එන්නේ
රුදුරු බියකරු සතුන් විලසින්නේ
රැක ගන්න සමිඳුනි මා
රැක ගන්න සමිඳුනි මා

හිරු උදා වී දවස ඇරඹෙන්නේ
දිවිය ගෙවුමට මා වෙහෙස වන්නේ
රැක ගන්න සමිඳුනි මා
රැක ගන්න සමිඳුනි මා

අඳුරු සිතිවිලිවලින් වට වෙන්නේ
දුක් සුසුම් පැරදුම් වෙළා ගන්නේ
රැක ගන්න සමිඳුනි මා
රැක ගන්න සමිඳුනි මා

පියවර 4 : • සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
- එක් එක් කණ්ඩායමට $A_4$ කොළ කිහිපය බැගින් ලබා දෙන්න.
- ලබා දුන් කොළවල දෙවි පියා විසින් මවන ලද සතුන් ඇඳ නම් ලිවීමට යොමු කරන්න.
- අවසානයේ කණ්ඩායම්වල කොළ එකතු කර පොත් පිංචක් සැදීමට සිසුන් යොමු කරන්න.

**තක්සේරුව :**

- දේව සමානකමට මවන ලද මිනිසා සතු යහපත් ගුණාංග ලියා දක්වයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- දේව සමානකමට මවන ලද මිනිසාට ගෞරව කරයි.

## 1.0 තේමාව : මහෝත්තම දෙව් පියාණන් වහන්සේට ආදරය කිරීම

**නිපුණතාව** : මහෝත්තම දෙව් පියාණන්ගේ ආදරය, මැවිල්ල මඟින් අත් දකියි. තුති පුදයි, ප්‍රතිප්‍රේමය දක්වයි.

**ඉගෙනුම් පල** : 1.4

- පාපයට වැටුණු ආදම් සහ ඒවට දෙව් පියාණන් වහන්සේ සමාව දුන් ආකාරය සාකච්ඡා කරයි.
- තමා අතින් සිදුවුණු වැරදිවලට සමාව ඉල්ලා දයාවේ කරුණාවේ දෙව් පියාණන් වහන්සේට යාච්ඤාවක් ලියයි.

**ඉගෙනුම් සම්පත්** :

- ආදේශ සංගීත භාණ්ඩ
- කිතුනු ගී පොත
- රංගනයට යෝග්‍ය ඇඳුම්
- ගීතිකාව අඩංගු පෝස්ටරය
- පෙළ පොත

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- සියලු ම සිසුන් එළිමහනට ගෙනගොස් දෑස් පියාගැනීමට යොමු කරන්න.
- උදේ අවදි වූ මොහොතේ සිට ඔවුන්ගේ සිතිවිලි මෙලෙස අවදි කරන්න.
    - i. උදෑසන අවදි වූ විට දෙව් පියාට ස්තුති කිරීම
    - ii. අද දවස දෙව් පියාණන්ට බාර කිරීම
    - iii. නිදාගත් ස්ථානය පිළිවෙලට තැබීම. (ඇඳ ඇතිරිලි, රාත්‍රී ඇඳුම්)
    - iv. පිරිසිදු වීමේ කටයුතු
    - v. උදෑසන ආහාරය (පරිහරණය කළ බඳුන් පිරිසිදු කිරීම)
    - vi. දෙමාපියන් නැමදීම
- ඉහත සඳහන් කරුණු මෙනෙහි කිරීම මඟින් ඔවුන් අතින් සිදු වූ වැරදි පෙන්වා දී නැවත නොකරන්නට සිසුන් යොමු කරන්න.

පියවර 2 :

- පහත ගීතිකාව විශාල කර පන්තියේ ප්‍රදර්ශනය කරන්න. (කිතුනු ගී 281)

කමා කළ මැනේ සුරිඳුනි  
කමා කළ මැනේ  
අප හැම කළ වැරදිවලට  
කමා කළ මැනේ

අසීමිත වූ ඔබේ පෙමට - නිගරුව පිටුපා  
නොමඟට ගිය අපහට වෙනු - මැන අනුකම්පා

කමා කළ මැනේ . . .

සිතින් කයින් වදනින් රුදු - පවට නැඹුරු වී  
සොහොයුරු පෙම පළුදු වුණේ - සාමය කඩ වී

කමා කළ මැනේ . . .

- පන්තියේ සියලු සිසුන් සමඟ ගීතිකාව ගායනා කරන්න.
- ගීතිකාවේ අඩංගු වන පරිදි සිතින්, කයින්, වචනෙන් කරන වැරදි මොනවා දැයි සිසුන්ගෙන් විමසන්න.

පියවර 3 :
- පෙළ පොතේ අඩංගු වන විරිදු පෙළ අවබෝධයෙන් යුතු ව ගායනයට යොමු කිරීම
- විරිදු පෙළ ආශ්‍රිත ව ප්‍රශ්න කිහිපයක් අසන්න.
  i. සර්පයකුගේ වෙස් ගත්තේ කවරෙක් ද ?
  ii. ආදම් වැරදි මගට ගත්තේ කවුරු ද ?
  iii. ඔවුන් කළ පාපය කුමක් ද ?
  iv. දේව තාත්තා ආදම්ට සහ ඒවට දුන් දඬුවම් මොනවා ද ?
  v. පුංචි අපි වැරදි හදා ගන්නේ කෙසේ ද ?

**තක්සේරුව :**

- එදිනෙදා සිදුවන වැරදිවලට කමාව ඉල්ලා යාච්ඤාවක් ලියයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- රාත්‍රි නින්දට පෙර එම දවස තුළ තමා අතින් සිදු වූ වැරදි මෙනෙහි කර දෙවි පියාණන් වහන්සේගෙන් සමාව අයැදීම.

## 1.0 තේමාව : මහෝත්තම දෙව් පියාණන් වහන්සේට ආදරය කිරීම

**නිපුණතාව** : **මහෝත්තම දෙව් පියාණන්ගේ ආදරය, මැවිල්ල මඟින් අත් දකියි. තුති පුදයි, ප්‍රතිප්‍රේමය දක්වයි.**

**ඉගෙනුම් පල** : 1.5

- නිවසේ දී දරුවන් වශයෙන් දෙමවුපියන්ට, වැඩිහිටියන්ට කීකරු වූ අවස්ථා සිසු කණ්ඩායම් තුළ සාකච්ඡා කරයි.
- පවුල තුළ සහයෝගයෙන්, ආදරයෙන් කටයුතු කළ හැකි ආකාරය ලියා දක්වයි.
- තම ප්‍රදේශය තුළ පොදු කටයුත්තක දී සහයෝගය දැක්වූ ආකාරය චිත්‍රයකට නඟා ඒ පිළිබඳ ව තුති දෙමින් යාච්ඤා කරයි.
- පාසල තුළ අවනත භාවයෙන් හා සහයෝගයෙන් කටයුතු කළ හැකි අවස්ථා යෝජනා කරයි.
- දෙව් පියාණන් වහන්සේට ප්‍රතිප්‍රේමය දැක්වීමක් වශයෙන් දහම් පාසල තුළ පූජක, පැවිදි හා දහම් ගුරුවරුන්ට කීකරු විය හැකි අවස්ථා රඟ දක්වයි.
- ඒ අය වෙනුවෙන් දෙව් පියාණන් වහන්සේට තුති පුදයි.

**ඉගෙනුම් සම්පත්** :
- සකස් කරන ලද වගුව
- වගන්ති ලියූ පත්‍රිකා
- කිතුනු ගී පොත

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :
- සිසු කණ්ඩායම්වලට පහත සඳහන් අයුරින් සාදාගත් වැකි අඩංගු පත්‍රිකා බෙදා දීම
  * නිවස පිරිසිදු කිරීම.
  * කුඩා සහෝදර සහෝදරියන් බලා ගැනීම.
  * ගුරුතුමිය විසින් පවරන ලද වගකීම් ඉටු කිරීම.
  * කණ්ඩායම් තුළ ද්‍රව්‍ය බෙදා ගැනීම.
  * මාර්ගයේ ඇති බාධාකාරී දේ ඉවත් කිරීම.
  * දහම් පාසලේ දී සමඟියෙන් සිටීම.
- පහත වගුව විශාල ලෙස සකස් කර පන්තියේ ප්‍රදර්ශනය කරන්න

| නිවස | ගම/නගරය | පාසල | දහම් පාසල |
|---|---|---|---|
| | | | |

- තමන් ලද වැකි යෝග්‍ය පරිදි වගුවේ රැඳවීමට සිසු කණ්ඩායම් යොමු කරන්න.

පියවර 2 : • ඉහත වගුව අනුව එක් එක් තීරු සඳහා සුදුසු වෙනත් යෝජනා ඉදිරිපත් කිරීමට කණ්ඩායම්වලට බෙදා දීම.

• සහයෝගයෙන් හා අවනත භාවයෙන් කටයුතු කිරීමේ අගය පහදා දෙන්න.

• සිසුන් ගෙන් මතු වන යහපත් ප්‍රතිචාර ඇගයීමට ලක් කරන්න.

• දහම් පාසල තුළ දී පූජක, පැවිදි අයට කීකරු වීමට ද, ඔවුන් වෙනුවෙන් දෙවි පියාණන්ට තුති පිදිය යුතු බව ද අවබෝධ කර දෙන්න.

පියවර 3 : • කණ්ඩායම් ලෙස ලද වගුවේ ශීර්ෂ පාඨ අනුව අවනත භාවයෙන් සහ සහයෝගයෙන් කටයුතු කිරීමට ඉදිරිපත් කළ යෝජනාවක් රඟ දැක්වීමට සිසු කණ්ඩායම් යොමු කරන්න.

පියවර 4 : • සිසුන් සමඟ පහත ගීතිකාව ගායනා කරන්න. (කිතුනු ගී 273)

සාම මිහිර විහිදා
දහම් සුවඳ පතුරා
යහමඟ යන්නට ජේසු තුමෙනි
ඔබ සහය අපට දේවා

සාමෙන් ප්‍රේමෙන් එකට වෙළී
අලුත් ලොවක් හදලා
එකතු වෙලා වැඳ වැටිලා අපි
දෙවි උතුමන් වඳිමු

දයා ප්‍රේමෙනුයි අපගේ
ජීවිත බබළන්නේ
සතුරන් හට වුව මෙත් වඩවන්ටයි
කිතු තුම අත දෙන්නේ

ජීවිත සැනසුම අපගේ
ඔබ ය ජේසු තුමෙනි
ඔබ ආලෝකය ලද අය දැල්වෙති
කිසි මැ දිනක නොනිවී

පියවර 5 : • ඉහත සඳහන් ගීතිකාවේ හිස්තැන් පිරවීමට යොමු කරන්න.

. . . . . . . . . විහිදා
. . . . . සුවඳ පතුරා
. . . . යන්නට . . . . . . . . .
ඔබ . . . . . අපට දේවා

**තක්සේරුව :**

• ඔබ සහයෝගයෙන් හා අවනත ව කටයුතු කළ ආකාරයට චිත්‍රයට නඟයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

• පොදු කටයුතුවල දී නොපැකිළ ව අවනත භාවයෙන් කටයුතු කරයි.

## 1.0 තේමාව : මහෝත්තම දෙව් පියාණන් වහන්සේට ආදරය කිරීම

**නිපුණතාව** : **මහෝත්තම දෙව් පියාණන්ගේ ආදරය, මැවිල්ල මඟින් අත් දකියි. තුති පුදයි, ප්‍රතිප්‍රේමය දක්වයි.**

**ඉගෙනුම් පල** : 1.6

- පල්ලියේ මංගල්‍යයේ දී/ගමේ පොදු වැඩක දී අසල්වැසියන් සමඟ එකමුතු වී කටයුතු කරන අවස්ථා පෝස්ටර් මඟින් ප්‍රදර්ශනය කරයි.
- විවිධ ආගමික උත්සව අවස්ථාවල දී පන්තියේ ළමයින් සමඟ සහජීවනයෙන් කටයුතු කරමින් මිතුදම් ගොඩනගා ගත හැකි විවිධ ක්‍රියාකාරකම් ලියා දක්වයි.
- යහපත් මිතුරු සබඳතා පවත්වා ගැනීමට අවශ්‍ය වරම් පතා යාච්ඤාවක් සාමූහික ව උච්චාරණය කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- ශුද්ධ බයිබලය (ජොහන් 11:28-44)
- 'ලොවේ සැමා' ගීතය අඩංගු සංයුක්ත තැටිය
- ගීතය ලියූ පෝස්ටරය
- ඩිමයි කොළවලින් කපාගත් මල්
- පාට පැන්සල්, ගම්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- පන්තියේ සියලු සිසුන් නිහඬ ස්ථානයකට රැගෙන යන්න.
- ගෞරවයෙන් හා අවබෝධයෙන් යුක්ත ව සියලු දෙනාට ම ඇසෙන පරිදි ශුද්ධ බයිබලයේ ජොහන් 11:28-44 පාඨය දෙවතාවක් කියවන්න.

> මාර්තා මෙසේ පවසා, ගොස් ඇගේ සොහොයුරිය වූ මරියා කැඳවා, 'ගුරු දේවයාණෝ වැඩම කර සිටිති. උන් වහන්සේ ඔබ කැඳවති'යි රහසින් කීවා ය. ඈ ඒ අසා නැගිට වහා ම උන් වහන්සේ වෙතට ගියා ය. ඒ වන තුරු ජේසුස් වහන්සේ ගමට ඇතුළු නොවී උන් වහන්සේට මාර්තා හමු වූ ස්ථානයෙහි ම නතර වී සිටි සේක. එවිට මරියා සනසමින් ඈ සමඟ ගෙයි සිටි ජුදෙව්වරු ඈ විගස නැගිට බැහැර යනු දැක, ඈ හඬන පිණිස සොහොන් ගේ ළඟට යන්නී යැයි සිතා ඈ පස්සේ ගියහ.
>
> මරියා ජේසුස් වහන්සේ සිටි තැනට අවුත්, උන් වහන්සේ දුටු කෙණෙහි පාමුල වැටී, 'ස්වාමීනි, ඔබ වහන්සේ මෙහි සිටි සේක් නම් මාගේ සහෝදරයා මැරෙන්නේ නැතැ'යි කීවාය. ජේසුස් වහන්සේ ඈ ද, ඈ සමඟ ආ ජුදෙව්වරුන් ද හඬනු දැක, සිතින් සුසුම් ලා කැලැඹී, 'ඔහු කොතැන තැන්පත් කළාහු ද'යි ඇසූ සේක. 'ස්වාමීනි, ඇවිත් බැලුව මැනවැ'යි ඔවුහු කීහ.
>
> ජේසුස් වහන්සේ හැඬූ සේක. එබැවින් ජුදෙව්වරු 'බලන්න, උන් වහන්සේ මොහුට ප්‍රේම කළ තරම' යැයි කීහ. එහෙත් ඔවුන්ගෙන් සමහරෙක් 'අන්ධයාගේ ඇස් පෑදුවේ උන් වහන්සේ නොවෙත් ද? එසේ නම්, මේ මිනිසාගේ මරණය වළක්වන්නට උන් වහන්සේට නොහැකි වීද'යි කීහ.
>
> එවිට නැවතත් ජේසුස් වහන්සේ . . .

- සවන් දුන් පාඨය සම්බන්ධ ව පහත සඳහන් ප්‍රශ්න සිසුන්ගෙන් විමසන්න.
  1. ඇඬුවේ කවරෙක් ද ?
  2. ඇයි ඇඬුවේ ?
  3. ඉන් පසු සිදු වූයේ කුමක් ද ?

පියවර 2 : • පහත ආකාරයට කපාගත් මල් දෙක බැගින් සිසුන්ට ලබා දෙන්න.




- අසල්වැසියන් සහ මිතුරු-මිතුරියන්/පන්තියේ ළමයින් ලෙස මල් දෙකෙහි මැද වෙන වෙන ම ලියා ගැනීමට සිසුන් යොමු කරන්න.
- පෙර සූදානම් කරගත් ගසක රූපය ඇති පෝස්ටර් දෙක තුළ සිසුන්ගේ නිර්මාණ රඳවන්න.
- ඉහත ක්‍රියාකාරකම පන්තියේ සිටින සිසුන් ප්‍රමාණය අනුව කණ්ඩායම් ලෙස යොදා ගන්න.

*උදා :*



පියවර 3 : • 'ලොවේ සැමා' ගීතය ලියූ පෝස්ටරය පන්තියේ ප්‍රදර්ශනය කරන්න.

ලොවේ සැමා එක ම දූයේ - දූ දරුවන් වේවා
වාද නැතී බේද නැතී - ලස්සණ ලොව හෙට අපට උදා වේවා

මනුස්සකම් අහක දමා - ජාතිවාදයෙන් උදම් අනා
සතුරුකමින් පිල් බෙදිලා - මිනිසා මුළා වෙලා
මනු දූයේ මිනිසුනේ - වාද වීලා පල නැතේ
එක රැනේ වාසෙ වෙමූ - සැමදෙන එකට බැඳී

ලොවේ සැමා . . .

වැටුණු කෙනෙකු හට - නැඟී සිටින්නට
අත දෙන්නට පැකිලෙන්න එපා
ඔහුගේ රට ජාතිය ආගම කුල
ගොත ගැන හොයන්න එපා
සාමයේ ගීතිකා පතුරාලා මුළු ලෝ තලේ
එක යායේ වාස වෙමු - සැමදා එකට බැඳී

ලොවේ සැමා

- සිසුන් සියලු දෙනා සමඟ අත්වැල් අල්ලා ගනිමින් ඉහත ගීතය ගායනා කරන්න.

පියවර 4 : • පහත සඳහන් යාච්ඤාව පන්තියේ සිසුන් සමඟ උච්චාරණය කරන්න.

ආදර දෙවි පියාණනි, ඔබ වහන්සේගේ පුත්‍රයාණන් වන ජේසු සමිඳාණන්ගේ මිතුරා වන ලාසරස් හට ප්‍රේම කළ ආකාරයට අපටත් ප්‍රේම කරන්නට පිහිට වුව මැනව. පන්තියේ මිතුරු-මිතුරියන්ට, අසල්වැසියන්ට අවංක සිතින් ප්‍රේම කරන්නට අවශ්‍ය වරම් ලබා දුන මැනව. ආමෙන්.

**තක්සේරුව :**

- පාසලේ දී සහ අසල්වැසියන් සමඟ මිතුදම් ගොඩනඟා ගන්නා ආකාරය ප්‍රකාශ කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- සියලු දෙනා සමඟ සහජීවනයෙන් කටයුතු කිරීම.

## 1.0 තේමාව : මහෝත්තම දෙවි පියාණන් වහන්සේට ආදරය කිරීම

**නිපුණතාව** : මහෝත්තම දෙවි පියාණන්ගේ ආදරය, මැවිල්ල මඟින් අත් දකියි. තුති පුදයි, ප්‍රතිප්‍රේමය දක්වයි.

**ඉගෙනුම් පල** : 1.7

- රෝගීන් හා විශේෂ අවශ්‍යතා ඇති අය වෙනුවෙන් 'සුවය හා කරුණාව ලැබේවා'යි අයැදිමින් දෙවි පියාණන් වහන්සේට යාච්ඤා කරයි.
- අසරණ හා අනාථ අයට උදවු කළ හැකි අයුරු සිසු කණ්ඩායම් තුළ සාකච්ඡා කරමින් එක් එක් කණ්ඩායම මඟින් යෝජනා ලියා ඉදිරිපත් කරයි.
- ළදරු හා මහලු අයගේ අවශ්‍යතා ලැයිස්තුගත කරමින් ඒවා සපුරාලීමට තමන්ට හැකි අයුරින් දායක විය හැකි ක්‍රම ප්‍රකාශ කර ඒ සඳහා යාච්ඤා කරයි.
- සතුන්ට ආදරය දක්වන අයුරු ලියා දක්වමින් එය චිත්‍ර මඟින් ඉදිරිපත් කරයි.
- පාසල් භූමියේ ඇති මල් පාත්ති, ගස්වැල්වලට ආදරය දක්වමින් තමන්ට නියමිත දිනවල දී ඒවාට පොහොර, වතුර දමා අලුත්වැඩියා කර ඒවා රැකබලා ගැනීමට කටයුතු කරයි.

**ඉගෙනුම් සම්පත්** :
- රෝගී අය/විශේෂ අවශ්‍යතා ඇති අය/අසරණ අයගේ පින්තූර දැක්වෙන පෝස්ටරයක්
- පැස්ටල්
- පැවරුම් පත්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :
- අදාළ පෝස්ටරය පන්තිය ඉදිරියේ සියලු සිසුන්ට පෙනෙන ආකාරයට ප්‍රදර්ශනය කරන්න.
- පෝස්ටරය මඟින් දුටු දේ පිළිබඳ තොරතුරු සිසු කණ්ඩායම්වලින් ලියා ඉදිරිපත් කිරීමට යොමු කිරීම.
- පහත ආකාරයේ පෝස්ටරයක් සකසා ගන්න.

පියවර 2 :
- පහත පැවරුම් පත පන්තියේ සිසුන් සියලු දෙනාට බෙදා දෙන්න.

පැවරුම් පත

පහත සඳහන් පුද්ගලයන් සඳහා ඔබට කළ හැකි දේ ලියන්න.

1. රෝගීන්ට

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. ආබාධිත අයට

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

3. අසරණ හා අනාථ අයට

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

4. ළදරු හා මහලු අයට

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

5. සතුන් හා ගස්වැල්වලට

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

- පිළිතුරු ලියන ලද පැවරුම් පත අභ්‍යාස පොතේ අලවා ගැනීමට යොමු කරන්න.

පියවර 3 : • සිසු කණ්ඩායම්වලට පාසල් වත්තේ එක් එක් ස්ථාන බෙදා දෙන්න.

• නියමිත දිනවල දී තම කණ්ඩායමට අයත් කොටස පිරිසිදු කිරීම, වතුර දැමීම, පොහොර දැමීම ආදි ලෙස සුරැකීමට යොමු කරන්න.

පියවර 4 : • සිසු අවශ්‍යතා පරිදි නිර්මාණාත්මක යාච්ඤා ප්‍රකාශ කිරීමට යොමු කරන්න.

**තක්සේරුව :**

- මහලු, රෝගී, අසරණ අයට දයාව දැක්විය හැකි අයුරු චිත්‍රයට නඟයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- රෝගී, අසරණ හා මහලු අය වෙනුවෙන් යාච්ඤා කරයි.

## 1.0 තේමාව : මහෝත්තම දෙව් පියාණන් වහන්සේට ආදරය කිරීම

**නිපුණතාව** : මහෝත්තම දෙව් පියාණන්ගේ ආදරය, මැවිල්ල මගින් අත් දකියි. තුති පුදයි, ප්‍රතිප්‍රේමය දක්වයි.

**ඉගෙනුම් පල** : 1.8

- නිවසෙන් බැහැර කරන ලද කුණු ක්‍රමවත් ව ඉවත් කරන අයුරු සාකච්ඡා කර නිවසේ කොම්පෝස්ට් පෝර වළක් සෑදූ ආකාරය විස්තර කරයි.
- පාසල් භූමිය තුළ දක්නට ලැබෙන ඉවත ලන ද්‍රව්‍ය නිසි අයුරින් කළමනාකරණය කරයි.
- පවිත්‍රතාවේ සතුට ප්‍රකාශ කරමින් දෙව් පියාණන් වහන්සේට ගීතිකාවක් ගායනා කරයි.
- දෙව්මැදුර හා අවට ප්‍රදේශය සතුටින් හා එකමුතුවෙන් පිරිසිදු කරයි.
- දෙව්මැදුර හා අවට වෙනත් පොදු ස්ථාන පවිත්‍ර ව තබා ගැනීමේ දීර්ඝ කාලීන වැඩසටහනක් යෝජනා කරයි.
- පරිසරය පවිත්‍ර ව තබා ගැනීමේ කුඩා අපගේ වගකීම නිසි පරිදි ඉටු කරන්නට අවශ්‍ය පිහිට පතා යාච්ඤාවක් ලියයි.

**ඉගෙනුම් සම්පත්** :
- 'ඉරෙන් හඳෙන්' ගීතය
- සිරිත් මල්දම
- යාච්ඤාව ලියූ පෝස්ටරය

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :
- පන්තියේ සියලු සිසුන් පාසල් වත්තට රැගෙන යන්න.
- සිසුන් කුඩා කණ්ඩායම් කිහිපයකට බෙදා පාසල් වත්තේ තෝරාගත් ස්ථාන කිහිපයකට යොමු කර එම ස්ථාන අපිරිසිදු වී ඇති අයුරු සොයා බලා වාර්තා කිරීමට යොමු කරන්න.
- එම ස්ථාන අපිරිසිදු වීමට හේතු සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- එම ස්ථාන පිරිසිදු ව තබා ගැනීමට කළ හැකි දේ පාසලේ ඉවතලන ද්‍රව්‍ය නිසි ලෙස බැහැර කිරීමට කළ හැකි දේ ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- දෙව් පියාණන් වහන්සේ අපට ගොඩක් ආදරේ නිසා දී ඇති අපේ පාසල, පාසල් වත්ත පිරිසිදු ව තබා ගත් විට දෙව් පියාණන් සතුටු වන බවත් අපට ඉගෙන ගැනීමට පිහිට වෙන බවත් පෙන්වා දෙන්න.
- පවිත්‍රතාවේ සතුට වෙනුවෙන් පහත ගීතය සිසුන් සමඟ ගායනා කරන්න.

**ඉරෙන් හඳෙන්**

ඉරෙන් හඳෙන් එළිය අරන් - ගඟෙන් වැලෙන් සුවඳ අරන්
ඇළෙන් දොළෙන් සිසිල අරන්
අපට සැදුණු අපේ ලෝකයේ - සතුටු වෙන්න එන්න යාළුවේ //

සමනළ තටු සිඳින්නෙපා - පාට මැකී යයි දේදුන්නේ
ගහවැල සිඳ දමන්නෙපා - පොළොව දැවී යයි ඉර ගින්නේ
අපට සැදුණු අපේ ලෝකයේ - සතුට සදා රකිමු යාළුවේ //

නටා ගයන බටිති මලිත්තෝ - අපා දෙපා සිවුපා ඇත්තෝ
ඉරේ හඳේ ගහේ වැලේ - අපි වගේම උරුමය ඇත්තෝ
අපට සැදුණු අපේ ලෝකයේ - සතුට බෙදා ගනිමු යාළුවේ //

පියවර 2 : • සිසුන් සමඟ තම නිවෙස්වල පවිත්‍රතාව පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- නිවසෙන් ඉවත ලන කුණු රොඩු බැහැර කරන අන්දම සිසුන්ගෙන් විමසා බලන්න.
- තම ගෙවත්ත තුළ කුඩා කොම්පෝස්ට් පොහොර වළක් සාදා ගැනීමෙන් අපට ප්‍රයෝජන ලැබෙන බව තහවුරු කරන්න.
- ගෙදර පිරිසිදුව තබා ගැනීමෙන් ද, මල් වවා අලංකාර කිරීමෙන් ද දෙව් පියාණන් අපේ ගෙදර සතුටින් පුරවන බව අවබෝධ කර දෙන්න.
- පහත කවිය සිසුන්ට ඉදිරිපත් කර සිසුන් සමඟ ගායනා කරන්න.

ගේ වට කුණු ගොඩවල් නොතියන්නේ
එළි කොට වත්ත ද සාදා ගන්නේ
සිහි කොට වැට කඩුලුත් බැඳපන්නේ
හරකට ගස කොළ ඇර නොතියන්නේ

(සිරිත් මල් දම)

පියවර 3 : • අපේ ගෙදර මෙන් ම දෙව් පියාණන්ගේ ගෘහය වන දේවස්ථානය ද අලංකාර ව, පිරිසිදු ව තබා ගැනීම අපේ යුතුකමක් බව පහදා දෙන්න.
- දෙව් මැඳුර හා අවට පිරිසිදු ව තබා ගැනීමට කළ හැකි දේ සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- දෙව් මැඳුර මෙන් ම අප සියලු දෙනා එකතු වන පොදු ස්ථාන පිරිසිදු ව තබා ගැනීම අපේ යුතුකමක් බව පහදා දෙන්න.
- එවැනි ස්ථාන පිරිසිදු ව තබා ගැනීමට කළ හැකි වැඩසටහනක් යෝජනා කිරීමට අවස්ථාව දෙන්න.

පියවර 4 : • පහත යාච්ඤාව පන්තියේ ප්‍රදර්ශනය කරන්න.

ආදර දෙව් පියාණනි, ඔබ වහන්සේ අපට ඇති ඉමහත් ආදරය නිසා අපට දී තිබෙන මෙම අලංකාර පරිසරයට ස්තුතිවන්ත වෙමු. එම පරිසරය දිනපතා ම පවිත්‍ර ව තබා ගැනීම පුංචි අපගේ වගකීමක් බව මතක් කළ මැනව. මෙම පරිසරය ආරක්ෂා කර ගැනීමට හා පිරිසිදු ව තබා ගැනීමට අවශ්‍ය වරම් ලබා දුන මැනව. ආමෙන්

- සිසුන් සියලු දෙනා සමඟ මෙම යාච්ඤාව උච්චාරණය කරන්න.
- පසු ව එය අභ්‍යාස පොතේ ලියා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.

**තක්සේරුව :**

- පන්ති කාමරය හා පාසල අවට පිරිසිදු කිරීමට කරන දේ ලැයිස්තුගත කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- සතුටින් හා එකමුතුවෙන් පරිසරය පිරිසිදු කිරීමට දායක වෙයි.

## 2.0 තේමාව : මහෝත්තම දෙවි පියාණන් වහන්සේ සමඟ කතා කිරීම

**නිපුණතාව** : **මහෝත්තම දෙවි පියාණන් වහන්සේ සමඟ කතා කරයි.**

**ඉගෙනුම් පල** : 2.1 (A)

- නිවස තුළ දෙවි පියාණන් වහන්සේට කතා කළ හැකි සෑම අවස්ථාවක් ම නම් කරයි.
- රාත්‍රියේ සෑම අනතුරකින් ම ආරක්ෂා කළ දෙවි මහෝත්තමයාණන්ට අවදි වූ විගස තුති දෙමින් කිව හැකි යාච්ඤාවක් ලියා දක්වයි.
- මුළු දවස පුරා ලද දේව වරප්‍රසාද සඳහා තුති දෙමින් දේව ආරක්ෂාවට නතු වීම සඳහා කිව හැකි යාච්ඤාවක් ඇතුළත ප්‍රදර්ශනය කරයි.
- අපට ආහාර ලබා දීමට දායක වූ සෑම සියලු දෙනා නම් කර, එම සේවා ලියා දක්වයි.
- පාඩම ආරම්භ කිරීමට පෙර ශුද්ධාත්මයාණන් වහන්සේට ගීතිකාවක් ගයමින් ශුද්ධාත්ම වරම් අයැදියි.
- පාඩම අවසානයේ ලද දීමනා සඳහා තුති දීමේ ගීතිකාවක් ගායනා කරයි.
- ගමනක් යාමට පෙර දේව ආරක්ෂාවට භාර වෙමින් ගමනේ සාර්ථකත්වය සඳහා යාච්ඤා කොට, ගමන නිම වූ පසු ස්තුති දීමට කිව හැකි යාච්ඤාවක් ලියා දක්වයි.

**ඉගෙනුම් සම්පත්** :

- කිතුනු ගී පොත
- යාච්ඤාවක නියැළෙන පින්තූරයක්
- අපට ආහාර ලබාදෙන අයගේ පින්තූර අඩංගු පෝස්ටරයක්
- යාච්ඤාව අඩංගු පෝස්ටරය

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- දේවස්ථානයට හෝ යාච්ඤා කිරීමට සුදුසු ස්ථානයකට හෝ සිසුන් රැගෙන යන්න.
- පහත ගීතිකාව සිසුන් සමඟ ගායනා කරන්න.

**කිතුනු ගී (426)**

ශුද්ධාත්මෙනී // වඩින් ශුද්ධාත්මෙනී
මා ජීවිතේ ආලෝකෙනී වඩින් ශුද්ධාත්මෙනී

ඔබේ වරම් මගේ හදේ මවා ශුද්ධාත්මෙනී
මා ජීවිතේ ආලෝකවත් කරන්න ස්වාමිනී
දූවී දූවී සිලෙන් ගනී රකින් ඔපේ නැගේ
ඔබේ පෙමින් එසේ අපත් දවන්න ස්වාමිනී

ඉරේ රැසේ වැදී විලේ නෙළුම් පිපෙන ලෙසේ
ඔබේ දයා රැසින් අපත් පුබුදු කරනු මැනේ

පියවර 2 :

- යාච්ඤාව අඩංගු පෝස්ටරය ප්‍රදර්ශනය කොට නිවැරදි ඉරියව්වලින් යුක්ත ව බැතියෙන්, ගෞරවයෙන් හා අවබෝධයෙන් එම යාච්ඤාව සිසුන් සමඟ උච්චාරණය කරන්න.

දයාබර දෙවි පියාණනි, ඔබ වහන්සේ අප ඊයේ රාත්‍රියේ සෑම අනතුරකින් ම ආරක්ෂා කර, අද දවස ගත කිරීම සඳහා අපට ජීවිතය ලබා දුන්නාට ගොඩක් ස්තුතියි. අද දවසේ අපගේ සිතිවිලි, වචන සහ අප කරන ක්‍රියාවන් ඔබ වහන්සේගේ දෑතට බාර කරමු. අද දවස තුළ ඔබ වහන්සේගෙන් ඈත් නොවී ප්‍රසන්න දරුවකු ලෙස ජීවත් වන්නට මට උදවු වෙන්න. පුංචි මා ආශීර්වාද කර රැකබලා ගන්න. ආමෙන්

පියවර 3 :

- යාච්ඤා කරන පින්තූරය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- එම පින්තූරය ඇසුරෙන් සිසුන් සමඟ සංවාදයක් ගොඩනඟන්න.
- පින්තූරයෙන් ප්‍රදර්ශනය වන අදහස් විමසන්න.
- නිවස තුළ දෙවි පියාණන් වහන්සේට කථා කළ හැකි අවස්ථා පිළිබඳ විමසන්න.
- පහත සඳහන් අවස්ථා මතු කරන්න.
  * අවදි වූ විට හා නින්දට යාමට පෙර
  * කෑමට පෙර හා පසු
  * ගමනක් යාමට පෙර හා පසු
  * පාඩම් කිරීමට පෙර හා පසු
  * රෝගී අවස්ථා
- මෙම අවස්ථාවල දී තුති පිදීමට මෙහෙයවන්න.
- මුළු දවස පුරා ලද දේව වරප්‍රසාද සඳහා තුති දෙමින් ඇඳ ළඟ ප්‍රදර්ශනය කළ හැකි යාච්ඤාවක් නිර්මාණය කිරීමට සිසු කණ්ඩායම් යොමු කරන්න.
- නිර්මාණය කරන ලද යාච්ඤාව තම ඇඳ ළඟ ප්‍රදර්ශනය කිරීමට යොමු කරන්න.

පියවර 4 :

- අපට ආහාර ලබාදෙන අයගේ පින්තූර ඇතුළත් කර සූදානම් කරගෙන ඇති පෝස්ටරය ඉදිරිපත් කරන්න.
- පෝස්ටරය ඇසුරෙන් අපට ආහාර ලබා දීමට දායක වන අය නම් කිරීමට සිසුන් යොමු කරන්න.
- එම පුද්ගලයන් ලියා දක්වන්න.
- අවසානයේ මේ සෑම සියලු දීමනාවන් සඳහා ම තුති දෙමින් පහත ගීතිකාව ගායනා කරන්න.

**කිතුනු ගී (259)**

තුති පුදම් ඔබට සමිඳේ
මුළු හදවතින් මගේ
මගේ මියේ බස් ඔබ ඒ ඇසුවෝ

සුර දූවන් හමුවේ
පුදම් ඔබට තුති ගී //

ඉදිරියෙ මගෙ දෙව් මැඳුරේ
මුහුණින් සිටිමි වැටී
පෙර කිසි කලෙකත් නොඇසූ විරූ
ඔබෙ හිතවත්කම් සෙනේ නිසා
පුදම් ඔබට තුති ගී //

ඔබ හට මා අඬ ගැසූ දිනේ
මට පිළිතුරු දුන්නෝ
හිතේ සවිය මගෙ ඔබ වැඩුවෝ
ඔබෙ බස'සා රජවරු පොළොවේ
පුදති ඔබට තුති ගී //

උසස් නමුත් සමිඳරුවාණෝ
පහතුන් විමසන්නෝ
සිතින් උඩඟු වූවන් එතුමෝ
ඈත හිටන් අඳුනාගන්නෝ //

පියවර 5 : • පහත සඳහන් පරිදි පත්‍රිකා සෑම සිසුවකුහට ම ලබා දෙන්න.



- උදෑසන අවදි වී යාච්ඤා කළ සෑම දිනක ම රූපයේ සූර්යයාගේ කොටස පාට කිරීමට ද,
- රාත්‍රියේ නින්දට යාමට පෙර යාච්ඤා කළ සෑම දිනක දී ම සඳුගේ කොටස පාට කිරීමට ද සිසුන් හට උපදෙස් දෙන්න.

**තක්සේරුව :**

- දෙවි පියාණන් වහන්සේට කථා කළ හැකි සෑම අවස්ථාවක් ම නම් කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- දෛනික ජීවිතය තුළ සෑම අවස්ථාවකදී ම යාච්ඤාවේ යෙදීම හා ලද නොලද සියලු ම දේට තුති පිදීම

## 2.0 තේමාව : මහෝත්තම දෙව් පියාණන් වහන්සේ සමඟ කතා කිරීම

**නිපුණතාව** : **මහෝත්තම දෙව් පියාණන් වහන්සේ සමඟ කතා කරයි.**

**ඉගෙනුම් පල** : 2.1 (B)

- පවුල් ජපමාලය අර්ථවත් කර ගැනීම සඳහා දේවමාතා ප්‍රතිමාව සැරසීමට ඔටුන්නක්, සළුවක්, මල් මාලයක් වැනි දෑ සූදානම් කරයි.
- පවුල් ජපමාලය උච්චාරණය කිරීමට නිවසේ පරිසරය යෝග්‍ය පරිදි සූදානම් කර ගැනීමට අවශ්‍ය පියවර ලැයිස්තු ගත කරයි.
- පවුලේ සියලු දෙනා එකට එකමුතු වී පවුල් ජපමාලය මඟින් දේව වචනය උච්චාරණය කරන බව අවබෝධයෙන් ප්‍රකාශ කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- ශුද්ධ බයිබලය
- සකස් කරන ලද විශාල ජපමාලයක්
- දේවමාතා ප්‍රතිමාව හෝ රූපයක්
- ඔටුන්නක්, සළුවක්, මල් මාලයක්
- එක් එක් සිසුවාට එක මල බැගින්
- මල් තැබීමට බඳුනක්
- පහත සඳහන් යාච්ඤා අඩංගු නිල යාච්ඤා පොතක්

  (මංගල්‍ය ආරාධනාව, විශ්වාස ලක්ෂණය, පරමණ්ඩලය, ත්‍රිත්ව ස්තෝත්‍රය, අහෝ මාගේ දෙවියනී, දිනට අනුව අභිරහස්, නමෝ මරිය යාච්ඤාව)
- කිතුනු ගී පොත

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :
- ඔටුන්න, සළුව, මල් මාලය දමා සූදානම් කරගත් ප්‍රතිමාව ඉදිරියේ මල් අතැති ව සිසුන් පෙළ ගස්වන්න.
- පහත සඳහන් ගීතිකාව අවබෝධයෙන් හා බැතියෙන් ගායනා කරවන්න.

**කිතුනු ගී (396)**

ජේසු අම්මෙ මේ අහන්න
ඔබේ දෑතට තුරුලු වන්න
සුදු සළු කොන අල්ල ගන්න
මට හරි ආසයි //

ජේසු අම්මෙ මේ අහන්න
ඔබෙ රසබර බස් අහන්න
ඔබෙ ඔවදන් පිළිපදින්න
මට හරි ආසයි //

ජේසු අම්මෙ මේ අහන්න
ඔබෙ රැකවරණය ලබන්න
ඔබේ උදවු පතා ඉන්න
මට හරි ආසයි //

ජේසු අම්මෙ මේ අහන්න
ඔබෙ අත ගෙන පිය මනින්න
ජේසු ළඟට හෙමින් යන්න
මට හරි ආසයි //

ජේසු අම්මෙ මේ අහන්න
සුර පුර වෙත ළඟා වෙන්න
සුර සැප මේ යැයි දකින්න
මට හරි ආසයි //

- ගීතිකාව ගායනා කරන අතරතුර සිසුන් අතැති මල් දේවමාතා ප්‍රතිමාව ඉදිරියේ පිදීමට සිසුන් මෙහෙයවන්න.

පියවර 2 :
- ජපමාලය යනු දේව වචනය උච්චාරණය කිරීමක් බව සිසුන්ට පහදන්න.
- පහත ශුද්ධ ලියවිලි පාඨ ගෞරවයෙන් උච්චාරණය කරන්න.

**ශුද්ධවර ලූක් 1 : 28 29**

දේව දූතයා ඈ සිටි තැනට පැමිණ, 'විපුල ප්‍රසාදලත් උත්තමිය, ඔබට මංගල වේ. සමිඳාණන් වහන්සේ ඔබ සමඟ ය'යි කීය. එහෙත් ඈ ඒ වදන් අසා අතිශයින් කැලඹී මේ කෙබඳු ආචාරයක් ද යි සිත සිතා සිටියා ය.

**ශුද්ධවර ලූක් 1: 41 42**

එලිසබෙත් මරිය තුමියගේ ආචාර බස් ඇසූ කල ඇගේ කුසෙහි දරුවා ඉපිලෙන්නට වන. එවිට එලිසබෙත් ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ ව මහ හඬින් උදන් අනමින් 'ඔබ වනිතාවන් අතර අතිශයින් ආශීර්වාද ලද්දී ය. ඔබ කුස ඔත් දරු ඵලය ද ආශීර්වාද ලද්දේ ය.'

- 'නමෝ මරිය' යාච්ඤාවෙහි අඩංගු වන්නේ දේව වචනය බව සිසුන් හට අවබෝධ කර දෙන්න.
- නමෝ මරිය යාච්ඤාවේ ප්‍රධාන කොටස් තුන පහත සඳහන් ආකාරයට අවබෝධ කර දෙන්න.
    1. දේව දූතයා මංගලම් කීම.
    2. එලිසබෙත් තුමියගේ ප්‍රකාශය
    3. ශුද්ධ වූ සභා මාතාවගේ ඉල්ලීම

පියවර 3 :
- විශාල ව සූදානම් කරගත් ජපමාලය සිසුන්ට පෙන්වන්න.
- ජපමාලය උච්චාරණය කරන විට ප්‍රකාශ කරන නිල යාච්ඤාවලට අදාළ ස්ථාන පිළිබඳ ව ජපමාලය ඇසුරෙන් සිසුන් දැනුම්වත් කරන්න.

පියවර 4 : • පහත සඳහන් පරිදි සකස් කරගත් අබිරහස් අඩංගු පත්‍රිකාව සිසුන්ට බෙදා දෙන්න.

**සොම්නස් අබිරහස්**

(සඳුදා, සෙනසුරාදා සහ ආගමන සමයේ ඉරුදිනවල)

1. දෙව් මවුන්ට මංගලම් කීම
2. එලිසබෙත් තුමිය බැහැ දැකීම
3. දෙව් බිලිඳාණන්ගේ උත්පත්තිය
4. දෙව් බිලිඳාණන් දේව මාලිගයේ පුද කිරීම
5. දේව කුමරා දේව මාළිගයේ නැති වී සිට සම්භ වීම

**දොම්නස් අබිරහස්**

(අඟහරුවාදා, සිකුරාදා සහ චතාරික සමයේ ඉරුදිනවල)

1. ජේසුස් වහන්සේ මල් උයනේ දුක් විඳීම
2. ජේසුස් වහන්සේ ගල් කණුවේ කස පහර විඳීම
3. ජේසුස් වහන්සේගේ හිස මත කටු ඔටුන්නක් පලඳවනු ලැබීම
4. ජේසුස් වහන්සේ කුරුසිය උසුලා ගෙන යෑම
5. ජේසුස් වහන්සේ කුරුසියෙහි උකුත් වීම

**මෝක්ෂ අබිරහස්**

(බදාදා සහ ඉරිදා දිනවල)

1. ජේසුස් වහන්සේ උත්ථාන වීම
2. ස්වාමීන් වහන්සේ ස්වර්ගාරෝහණ වීම
3. ශුද්ධාත්මයාණන් වැඩම කිරීම
4. දෙව් මවුන් ස්වර්ගාරෝහණය වීම
5. දෙව් මවුන් ස්වර්ග රාජ්‍යයෙහි ඔටුනු පැලැඳවීම

**ආලෝකයේ අබිරහස්**

(බ්‍රහස්පතින්දා දිනවල)

1. ජේසුස් ස්වාමීන් වහන්සේගේ බෞතීස්ම ස්නාපනය
2. කානා නුවර විවාහ මංගලෝත්සවය
3. කඳු මුදුනේ දේව රාජ්‍යය ප්‍රකාශ කිරීම
4. ජේසු ස්වාමීන් වහන්සේ අන්‍යරූප විලාස වීම
5. ජේසු සමිඳාණන් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කිරීම

• ජපමාලය උච්චාරණය කරන විට දිනට නියමිත අබිරහස් ප්‍රකාශ කිරීමෙන් දේව වචනය ප්‍රකාශ කරන බව සිසුන්ට පහදන්න.

**තක්සේරුව :**

• පවුල් ජපමාලය උච්චාරණය කිරීම සඳහා නිවසේ පරිසරය සූදානම් කිරීමට අවශ්‍ය දේ ලැයිස්තුගත කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

• නිතර ම ජපමාලය ළඟ තබා ගනිමින් පවුල් ජපමාලය උච්චාරණය කරයි.

## 2.0 තේමාව : මහෝත්තම දෙවි පියාණන් වහන්සේ සමඟ කතා කිරීම

**නිපුණතාව** : **මහෝත්තම දෙවි පියාණන් වහන්සේ සමඟ කතා කරයි.**

**ඉගෙනුම් පල** : 2.2

- දින 40ක් තුළ යෝග්‍ය පරිදි චතාරික භක්ති අභ්‍යාසවලට සහභාගි වෙයි.
- ජේසු සමිඳුන්ගේ දුක් විඳීම සිහිපත් කරමින් චතාරික සමය තුළ පාද නමස්කාර ස්ථාන ඉතා ගෞරවාන්විත ව රඟ දක්වයි.
- සිසුන් සිත් ගත් පාද නමස්කාර ස්ථාන චිත්‍රයට නගමින් එහි අන්තර්ගත පණිවිඩය පන්ති කාමරය තුළ දී ප්‍රකාශ කරයි.

**ඉගෙනුම් සම්පත්** :
- කිතුනු ගී පොත
- පාද නමස්කාරය අඩංගු නිල යැදුම් පොතක්
- රඟ දැක්වීමට අවශ්‍ය ඇඳුම් පැළඳුම්
- චිත්‍ර ඇඳීමට අවශ්‍ය කොළ, පැස්ටල්
- පාද නමස්කාරයේ ස්ථාන අඩංගු පින්තූර
- පොත් පිංච නිර්මාණයට අවශ්‍ය ද්‍රව්‍ය

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 : • සිසුන් දේවස්ථානයකට හෝ සූදානම් කරගත් ස්ථානයකට හෝ රැගෙන යන්න. යෝග්‍ය යාච්ඤා සහ ගීතිකා ගායනා කරමින් ගෞරවාන්විත ව පාද නමස්කාරයට සහභාගි කරවන්න.

**කිතුනු ගී 325**

ජේසුනී ලෝකයන් කෙරෙහි
බොහෝ සේ දයා වූයෙහි
දුෂ්ටයන්ගේ කුරිරු සිත්හි
පාප දොස් දුරු කෙළෙහි

කරුණා සාගරයෙනි
ක්ෂමා වුව මැනව
ජේසුනී මාගේ දෙවියනි
කරුණා කළ මැනව

ඔබගේ පාද පද්මයෙහි සිටිමු අපි ශෝක ව
පාපි වූ දාසයන් කෙරෙහි
උදහස් නූණ මැනව

### කිතුනු ගී 250

වැටි වැටි මා යළි යළි නැගිටින විට
මගෙ අත ගෙන මඟ පෙන්නුවා
විඩාව මගෙ සිත සසල කරන විට
දිරිය දෙවන සිතිවිලි එව්වා

සමිඳේ // මා මඟ සලකුණ ඔබ වේ
සමිඳේ // මා දිවිය සවිය ඔබ වේ

තණ්හා කාමය දෑස වැසූ විට
සැබෑ සතුට මට පෙන්නුවා
ජීවිත අරමුණ නොපෙනී යන විට
එළිය දෙවන ඔසුවක් වූවා

සමිඳේ // මා සැපත සතුට ඔබ වේ
සමිඳේ // මා දිව්‍ය ඔසුව ඔබ වේ

### කිතුනු ගී 360

කුරුසේ නැඟ අත් විහිදා
මුළු ලෝ තුරුලට බදලා
සිටිනා දෙව් පුත් රදුනේ
ඔබෙ පා සිඹිමින් වඳිමු

සිරසේ කිරුළේ මිණිසේ
බැබළේ බිඳු වැල් සිරිලේ
කුරුසේ සිටිනා දෙවිඳේ
ඔබෙ පා සිඹිමින් වඳිමු

ඔබ හා කුරුසේ නැඟලා
ඔබෙ දෑසින් ලොව බලලා
ඔබ සේ කරුණා පාලා
කුරුසේ හිඳිනා සමිඳේ

- පෙර සූදානම් කරගත් ස්ථාන කිහිපයක් පමණක් රඟ දැක්වීමට සිසුන්ට අවස්ථාව සලසන්න.

පියවර 2 :
- රඟ දැක්වූ පාද නමස්කාර ස්ථාන පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- පාද නමස්කාර ස්ථානවල ලියන ලද අදහස් කේවල ව ප්‍රකාශ කිරීමට අවස්ථාවන් සලසන්න.
- තමා වඩා සිත්ගත් පාද නමස්කාර ස්ථානය චිත්‍රයට නඟා එය පන්ති කාමරයේ ප්‍රදර්ශනය කිරීමට යොමු කරන්න.

පියවර 3 :
- චතාරික සමයේ සිසුන්ට කළ හැකි භක්ති අභ්‍යාස කවරේ ද යන්න සාකච්ඡා කරන්න.
- සිසුන් සහභාගි වූ භක්ති අභ්‍යාස අනුව (දිව්‍ය පූජා, පාද නමස්කාර, ශුද්ධ වූ පැය) පහත සඳහන් කුඩා කුරුස පාට කිරීමට යොමු කරන්න.

- මේ සඳහා පහත පරිදි සකසා ගත් පත්‍රිකාවක් බැගින් සිසුන්ට ලබා දෙන්න.



පියවර 4 :
- චතාරික සමයේ සිසුන් කරන ලද මර්දන ක්‍රියා විමසමින් ඒවා අගයන්න.
- එම මර්දන ක්‍රියා අඩංගු පොත් පිංචක් නිර්මාණය කිරීමට සිසුන් යොමු කරවන්න.

**තක්සේරුව :**

- පාද නමස්කාරයේ ස්ථාන හතක් නම් කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- චතාරික සමයේ යෝග්‍ය භක්ති අභ්‍යාසවල යෙදෙමින් මර්දන ක්‍රියා කිරීමට පෙළඹීම.

## 2.0 තේමාව : මහෝත්තම දෙවි පියාණන් වහන්සේ සමඟ කතා කිරීම

**නිපුණතාව** : **මහෝත්තම දෙවි පියාණන් වහන්සේ සමඟ කතා කරයි.**

**ඉගෙනුම් පල** : 2.3

- උතුම් ම දේව වන්දනාව වන දිව්‍ය පූජා යාගයට ඉතා බැතියෙන් සහභාගි වූ අවස්ථා ප්‍රකාශ කරයි.
- ඉරුදින හා ණය මංගල්‍ය දිනවල දිව්‍ය පූජාවට සහභාගි වීම අපගේ ණය යුක්තියක් බව ලියා ප්‍රදර්ශනය කරයි.
- දිව්‍ය පූජාවට සංවර ඇඳුමින් සැරසී නියමිත වේලාවට පැමිණ ක්‍රියාකාරී ව සහභාගි වූ අවස්ථා අඩංගු වගුව සම්පූර්ණ කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- ණය මංගල්‍ය දින ලියන ලද පෝස්ටරය
- දිව්‍ය පූජාවේ ප්‍රධාන පිළිවෙත් අඩංගු වන චිත්‍ර
- කිතුනු ගී පොත
- පින්තූර, බොරලික්කම් වැනි දෑ
- සකස් කරගත් වගුව

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 : • සිසුන් සියලු දෙනා සමඟ පහත ගීතිකාව ගායනා කරන්න.

**කිතුනු ගී 05**

යමු යමු යමු අපි මැඳුරට සමිඳුන්
පැවසූ සඳ ඔහු මා අමතා
මගේ හිසින් ගත් ඔවුන්ගෙ එබසින්
මගෙ හදවත පිපුණා
මගෙ හදවත පිපුණා

අපි දැන් එහි වමු ඔබ පා සෙවණේ
ඔබගේ වාසල් දොරටු තුළේ
සැරදේ ජෙරුසලමේ
සැරදේ ජෙරුසලමේ

හෝ

සමිඳුන් නම සඳහා
පුදනට තුති පූජා

- i. ඔබ අවසන් වරට දිව්‍ය පූජාවට සහභාගි වූ දිනය කුමක් ද ? (ඉරුදින දිව්‍ය පූජාවට සහභාගි වූ සිසුන් අගයන්න. සතියේ දිනවලත් දිව්‍ය පූජාවට සහභාගි වූ සිසුන් බොහෝ සේ අගයමින් ජේසු පින්තූරයක් වැනි සුළු තිළිණයක් ලබා දෙන්න.)
  ii. ඇයි ඔබ දිව්‍ය පූජාවට සහභාගි වන්නේ ? (පිළිතුර විය යුත්තේ උතුම් ම දේව වන්දනාව වන නිසා)
  iii. ඔබ දිව්‍ය පූජාවට භක්තියෙන් සහභාගි වූයේ කෙසේ ද ? (නිශ්ශබ්ද ව, දෑත් වැඳගෙන)

iv. ඔබ දිව්‍ය පූජාවට ක්‍රියාකාරී ව සහභාගි වූයේ කෙසේ ද ? (පිළිතුරු - ගීතිකා ගායනය/පඬුරු/සාමය පැතීම)

v. අවසන් වරට සහභාගි වූ පූජාවේ දී පියතුමා කළ ප්‍රකාශයක් විමසන්න. (පිළිතුරු - දරුවාට ඇසුණු දෙයක්)

පියවර 2 : • පහත වගුව සිසුන්ට බෙදා දෙන්න.

දිව්‍ය පූජාවට අර්ථවත් ව සහභාගි වීම සඳහා ඔබට කළ හැකි ක්‍රියා ඉටු කළේ නම් '√' ලකුණ ද, ඉටු නොකළේ නම් '•' ලකුණ ද සලකුණු කරන්න.

| ක්‍රියාකාරකම | ඉටු කිරීම/නොකිරීම |
|---|---|
| 1. නියමිත වේලාවට සහභාගි වීම | . . . . . . . . . . . |
| 2. සංවර ඇඳුම | . . . . . . . . . . . |
| 3. යාච්ඤා කීම | . . . . . . . . . . . |
| 4. දේව වචනයට සවන් දීම | . . . . . . . . . . . |
| 5. මිතුරන් සමග කතා නොකිරීම | . . . . . . . . . . . |
| 6. ගීතිකා ගායනය | . . . . . . . . . . . |
| 7. නියමිත ඉරියවු පවත්වා ගැනීම | . . . . . . . . . . . |

පියවර 3 : • ශ්‍රී ලංකාවේ ණය මංගල්‍ය අඩංගු පෝස්ටරය පෙන්වා එහි ඇති වැදගත්කම හඳුන්වා දෙන්න.

ණය මංගල්‍ය දින

1. දෙව් මවුන් වන මරිය තුමියගේ මංගල්‍යය - ජනවාරි 01
2. දේව මෑණියන් පරලොවට වැඩිය මංගල්‍යය - අගෝස්තු 15
3. දේව මෑණියන්ගේ නිර්දෝෂ පිළිසිඳීම - දෙසැම්බර් 08
4. නත්තල් මංගල්‍යය - දෙසැම්බර් 25
5. අවුරුද්දේ සෑම ඉරුදින ම

• ණය මංගල්‍ය දින අභ්‍යාස පොතේ සටහන් කර ගැනීමට සලස්වන්න.

පියවර 4 : • සිසුන් සමඟ පහත සඳහන් යාච්ඤාව භක්තියෙන් උච්චාරණය කරන්න.

ආදර දෙවි පියාණනි, උතුම්ම දේව වන්දනාව දිව්‍ය පූජාව බව පිළිගන්නට ද, ආදරයෙන් බැතියෙන්, ගෞරවයෙන් දිව්‍ය පූජාවට සහභාගි වන්නට ද, අපට මඟ පෙන්වන්න. තව ද නියමිත වේලාවට සරල ඇඳුමින් පැමිණ අන් අයට ද දිව්‍ය පූජාවට සහභාගි වීමට වරම් දෙන්න.

**තක්සේරුව :**

- ශ්‍රී ලංකාවේ ණය මංගල්‍ය දින 02ක් නම් කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- උතුම් ම වන්දනාව වන දිව්‍ය පූජාවට සහභාගි වෙයි.

## 2.0 තේමාව : මහෝත්තම දෙව් පියාණන් වහන්සේ සමඟ කතා කිරීම

**නිපුණතාව** : **මහෝත්තම දෙව් පියාණන් වහන්සේ සමඟ කතා කරයි.**

**ඉගෙනුම් පල** : 2.4

- 'සුරලොවේ පියාණනි . . .', 'සුරලෝ මඬලේ . . . ' ගීතිකා ගෞරවයෙන් හා භක්තියෙන් යුක්ත ව ගායනා කරයි.
- අපි දෙවි පියාට කථා කළ යුතු ආකාරය ස්වාමිවාක් ආරාධනාව මඟින් ජේසුස් වහන්සේ ඉගැන්වූ බව ප්‍රකාශ කරයි.
- සැම දෙන අත්වැල් අල්ලා එකට එකමුතු වී ස්වාමිවාක් ආරාධනාව උච්චාරණය කිරීමෙන් පසු එම යාච්ඤාව ලියා දක්වයි.
- ශුද්ධ වූ ත්‍රිත්වයට නමස්කාරයෙන්, ගෞරවයෙන් මහිමාන්විත ව ස්තුති ප්‍රශංසා පුද දෙමින් ත්‍රිත්ව ස්තෝත්‍රය උච්චාරණය කරයි.
- ත්‍රිත්ව ස්තෝත්‍රය තුළ වැඩ වසන ශුද්ධ වූ ත්‍රිත්වය නම් කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- ශුද්ධ බයිබලය
- කිතුනු ගී පොත
- ගීතිකාව ලියන ලද පත්‍රිකා
- සකස් කරන ලද අතේ ඇඟිලි අඩංගු පත්‍රිකා
- ත්‍රිත්ව ස්තෝත්‍රය ලියන ලද පෝස්ටරය

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :
- භාවනාවට යෝග්‍ය ස්ථානයකට සිසුන් රැගෙන යන්න.
- 'සුරලොවේ සුර පියේ' ගීතිකාව අඩංගු පත්‍රිකාව සිසුන්ට බෙදා දෙන්න.

**කිතුනු ගී 306**

සුරලොවේ සුරපියේ අසනු අප යැදුම් අනේ //

දින දින ඔබ නම ලොව සැම තැන පැතිරේ වා
ඔබ රජකම සැම දන හට සෙවණ ගෙනේ වා

ඔබ රිසි දෙය සුරලොව මෙන් මෙහි ඉටු වේ වා
අප කුස ගිනි නිවාලන්න අහර ලැබේ වා

මට කළ වරදට අනුනට සමාව දෙමි මා
මම කළ වරදට මා හට සමාව ලැබෙවා

සැම විට වරදට පෙලඹෙන මා ගැන සලකා
උවදුරු සැම ජය ගන්නට සරණය ලැබෙවා

- එම ගීතිකාව බැතියෙන් යුතු ව ගායනා කරන්න.

පියවර 2 : • දේව වචනයට ගෞරවාන්විත ව සවන් දීමට සිසුන් සූදානම් කරන්න.

ශුද්ධවර ලූක් 11 : 1 - 4 පාඨය කියවන්න.

## යාච්ඤාව පිළිබඳ අනුශාසනා

උන් වහන්සේ එක් තැනක යාච්ඤා කරමින් සිටි සේක. එය නිම වූ පසු උන් වහන්සේගේ ශ්‍රාවකයන්ගෙන් එක් තැනැත්තෙක් කතා කොට, 'ස්වාමිනි, ජොහන් තම ගෝලයන්ට ඉගැන්වූ ලෙස අපටත් යාච්ඤා කරන්නට ඉගැන්නුව මැනව'යි කීවේ ය. උන් වහන්සේ ඔවුන්ට මෙසේ වදාළ සේක. 'ඔබ යාච්ඤා කරන කල මෙසේ කියන්න

පියාණෙනි,

ඔබ වහන්සේගේ නාමයට ගෞරව වේ වා

ඔබ වහන්සේගේ රාජ්‍යය පැමිණේ වා

අපේ දිනපතා ආහාරය දිනෙන් දින අපට දුන මැනව

අපේ පවු අපට කමා කළ මැනව

මන්ද අපට ණයගැති ව සිටින

හැමට අප කමා වන බැවිනි

අප පරීක්ෂාවට නොපමුණුවනු මැනව

- සවන් දුන් දේව වාක්‍ය ඇසුරෙන් ප්‍රශ්න කිහිපයක් සිසුන් ගෙන් විමසන්න.
- ස්වාමිවාක් ආරාධනාව අවබෝධයෙන් හා බැතියෙන් යුක්ත ව අත්වැල් අල්ලාගෙන උච්චාරණය කරවන්න.

පියවර 3 : • සූදානම් කරගෙන ඇති අතේ ඇඟිලි හැඩැති පත්‍රිකා සිසුනට බෙදා දෙන්න.



- ස්වාමිවාක් ආරාධනාවේ අඩංගු පරිදි ඔබට වැරදි කළ අයට සමාව දුන් අවස්ථා 5ක් පත්‍රිකාවේ ඇඟිලිවල ලියා දක්වීමට යොමු කරන්න.

පියවර 4 : • ශුද්ධ වූ ත්‍රිත්වයට නමස්කාර කිරීමේ පෝස්ටරය වෙත සිසු අවධානය යොමු කරන්න.

පිතා පුත්‍රයා ස්ප්‍රිතු සාන්තු නම් ත්‍රිත්ව එක දෙවියොත්තමයාණන්ට ස්තෝත්‍ර වේවා.
ආදි වූවාක් මෙන් දැනුත් නිතිපතාත් අනන්ත කාලයක් ම වේවා ! ආමෙන්.

- ශුද්ධ වූ ත්‍රිත්වයට නමස්කාර කිහිප වතාවක් උච්චාරණය කරවන්න.
- ත්‍රිත්ව ස්තෝත්‍රය උච්චාරණය කර තුන් දෙනා වහන්සේලාගේ වැඩ සිටීම ගෞරවයෙන් හා භක්තියෙන් කළ යුත්තේ මන්දැයි විස්තර කරන්න. පිතා, පුත්‍රයා, ස්ප්‍රිතු යනු ශුද්ධ වූ ත්‍රිත්වය බව පවසන්න.
- දොහොත් මුදුන් දී දෑස් පියා ගනිමින් උච්චාරණය කරන ලද ත්‍රිත්ව නමස්කාරය භාවනායෝගී ව ප්‍රකාශ කරවන්න.
- එය රිද්මානුකූල ව ගායනා කරවන්න.

**තක්සේරුව :**

- ශුද්ධ වූ ත්‍රිත්වය නම් කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- ශුද්ධ වූ ත්‍රිත්වයට ගෞරවයෙන් වැඳ නමස්කාර කරයි.

## 3.0 තේමාව : මහෝත්තම දෙවි පියාණන් වහන්සේගේ ම දරුවකු වීම.

**නිපුණතාව** : **මහෝත්තම දෙවි පියාණන් වහන්සේගේ ම දරුවකු බවට පත් වෙයි.**

**ඉගෙනුම් පල** : 3.1

- දොළොස් වියැති ජේසු සමිඳුන් දේව මන්දිරයට ගොස් පඬිවරුන් හා සාකච්ඡා කළ සිදුවීම රඟ දක්වයි.
- දේව මාලිගය තුළ ළමා ජේසු සමිඳුන් දෙවි පියාණන් වහන්සේගේ ම දරුවකු ලෙස කටයුතු කළ ආකාරය විස්තර කරයි.
- දේව දරුවකු ලෙස ජීවත් වීමට අවශ්‍ය වරම් පතා යාච්ඤාවක් සකස් කර බිත්ති පුවත් පතේ ප්‍රදර්ශනය කරයි.
- ජේසු සමිඳුන් මරියතුමියට හා ජුසේ තුමාට කීකරු වෙමින් තම අත්දැකීම් බෙදා ගනිමින් ජීවත් වූ අවස්ථා චිත්‍ර, රචනා, කවි හෝ වෙනත් ක්‍රම හෝ මඟින් නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- ශුද්ධ බයිබලය
- රඟ දැක්වීමට අවශ්‍ය ඇඳුම්
- ලස්සණ සමනළයකු වාගේ ගීය
- ජේසු සමිඳුන් දේව මාලිගයේ පඬිවරුන් මැද කථා කළ අවස්ථාව දැක්වෙන පෝස්ටරයක්
- $A_4$ කොළ, රූල් කොළ, පැස්ටල්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :
- සිසුන් රංගනයට යෝග්‍ය ස්ථානයකට රැගෙන යන්න.
- පෙර සූදානම් කරගත් පරිදි ජේසු සමිඳුන් හා මල්, සමනළයින් වැනි චරිත ඇසුරින් පහත සඳහන් ගීතිකාවට පණ පොවන්න.

ළමයා : ලස්සණ සමනළයකු වාගේ
ඇදිලා යන මල් පාරේ
තටු සලා පියඹලා
ආවොත් හමු වේ දෝ, ජේසුනි ඔබ හමු වේ දෝ

ජේසු සමිඳුන් : ලස්සණ හොඳ ළමයකු වාගේ
නොසැලී යහපත පාරේ
පය තබා වෙහෙසිලා
ආවොත් මා හමු වේවී, ළමයෝ මා හමු වේවී

ළමයා : එක එක පාටින් සැරසීලා
හැඩ වැඩ ඇඳුමක් ඇඳලා
පියකරු සිනහවෙන්
ආවොත් ඔබ හමු වේ දෝ, ජේසු ඔබ හමු වේ දෝ

ජේසු සමිඳුන් : කීකරු හොඳ ළමයකු වාගේ
බැහැපත් ගතියෙන් සැරසී
ආදරේ පතුරුවා
ආවොත් මා හමු වේවී, ඔබටත් මා හමු වේවී

ළමයා : රත්තරනින් මාල දමාලා
මල් සුවඳවලින් නාලා
රන් රිදී පොදි අරන්
ආවොත් ඔබ හමු වේ දෝ, එලෙසින් ඔබ හමු වේ දෝ

ජේසු සමිඳුන් : නැති අය ආදරෙන් හොයාලා
ඇති සම්පත බෙදා හදා
වෙන කිසිත් නැති වුවත්
ඔබ හට මා හමු වේවී, එතකොට මා හමු වේවී

පියවර 2 :
- ජේසු කුමරු පඬිවරුන් මැද සිටින චිත්‍රය ප්‍රදර්ශනය කරන්න.
- අවධානයෙන් සවන් දීමට හැකි වන පරිදි ගෞරවයෙන් පහත බයිබල් පාඨය කියවන්න. (ශුද්ධවර ලූක් 2 : 41 - 51)

## ජේසු කුමරුන් දේව මාලිගයට යෑම

ජේසුස් වහන්සේගේ මවුපියෝ අවුරුදු පතා පාස්කු උලෙළ සඳහා ජෙරුසලමට ගියහ. උන් වහන්සේ දොළොස් හැවිරිදි වූ කල, ඔවුහු සිරිත් ලෙස ඒ මංගල්‍යයට ගියහ. ඔවුන් නියමිත දවස් ගෙවා පෙරළා එන අතර, ජේසුස් කුමරාණෝ ජෙරුසලමෙහි රැඳුණු සේක. එහෙත් උන් වහන්සේගේ දෙමවුපියෝ ඒ බව නොදන උන්වහන්සේ වන්දනාකාර පිරිස සමඟ ඇතැයි සිතාගෙන දවසක ගමන් ගොස්, නෑ මිතුරන් අතරෙහි උන්වහන්සේ සෙවූහ. එහෙත් සම්බ නොවූයෙන්, ඔවුහු උන්වහන්සේ සොයමින් ජෙරුසලමට පෙරළා ගියහ. තෙදිනකට පසු . . .

- පහත ප්‍රශ්න සිසුන්ගෙන් විමසන්න.
  1. ජේසු සමිඳුන්ගේ මවුපියන් ගිය නගරය කුමක් ද ?
  2. එහිදී සහභාගි වූ උත්සවය කුමක් ද ?
  3. ජේසු කුමරුන් ගියේ කවුරුන් සමඟ ද ?
  4. එහිදී ජේසු සමිඳුන් කළේ කුමක් ද ?

පියවර 3 :
- පන්තියේ සිසුන් කොටස් දෙකකට බෙදන්න.
- පෙළ පොතේ දෙබස රඟ දැක්වීමට යොමු කරන්න.
- දෙබස තුළින් ඉස්මතු වූ කරුණු සිසුන්ගෙන් විමසන්න.

පියවර 4 :
- පන්තියේ සිසුන් ශාන්ත තෙරේසා, ශාන්ත දොමිනික්, ශාන්ත සිසිලියා ලෙස කණ්ඩායම් තුනකට බෙදන්න.
- පහත මාතෘකාවට අනුව අදාළ පරිදි කණ්ඩායම් මඟින් නිර්මාණ ඉදිරිපත් කරවන්න.
  ජේසු සමිඳාණෝ තම දෙමාපියන්ට කීකරු වූහ.

ශාන්ත තෙරේසා - චිත්‍ර නිර්මාණ

ශාන්ත දොමිනික් - රචනා

ශාන්ත සිසිලියා - කවි

**තක්සේරුව :**

- දේව දරුවකු ලෙස ජීවත් වීමට අවශ්‍ය වරම් පතා යාච්ඤාවක් ලියා බිත්ති පුවත් පතේ ප්‍රදර්ශනය කිරීම

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- ජේසු සමිඳු වගේ සැම විට ම දෙමාපියන්ට කීකරුව ජීවත් වෙයි.

## 3.0 තේමාව : මහෝත්තම දෙවි පියාණන් වහන්සේගේ ම දරුවකු වීම.

**නිපුණතාව** : මහෝත්තම දෙවි පියාණන් වහන්සේගේ ම දරුවකු බවට පත් වෙයි.

**ඉගෙනුම් පල** : 3.2 (A)

- ජෝර්දාන් ගඟ අසබඩ දී බෞතිස්ම ස්නාපනය ලැබීමේ සිද්ධිය මඟින් ජේසුස් වහන්සේගේ දේව පුත්‍ර භාවය ප්‍රකාශ වූ ශ්‍රී වචන ලියා පන්තියේ ප්‍රදර්ශනය කරයි.
- ස්නාවක ජොහන් තුමාගෙන් බෞතීස්මය ලබාගත් ජේසු සමිඳුන් තුළ දක්නට ලැබෙන දේව දරුකමේ ගුණාංග 2ක් නම් කරයි. (බැහැපත්කම, කීකරුකම)

**ඉගෙනුම් සම්පත්** :
- ශුද්ධ බයිබලය
- ජේසුස් වහන්සේගේ බෞතිස්ම ස්නාපන සිද්ධිය දැක්වෙන චිත්‍රය
- දේව පුත්‍ර භාවය ප්‍රකාශ වූ ශ්‍රී වචන අඩංගු සංයුක්ත තැටිය හෝ පෝස්ටරය
- දේව පුත්‍ර භාවය කියවෙන වැකිය අඩංගු වචන පත්‍රිකා
- බ්‍රිස්ටල් බෝඩ්, ගම්
- පැවරුම් පත්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :
- පන්තියේ සියලු සිසුන්ට දෑස් පියා ගැනීමට සලස්වන්න.
- සංයුක්ත තැටිය මඟින් ජේසුස් වහන්සේගේ දේව පුත්‍ර භාවය ප්‍රකාශ වූ ශ්‍රී වචන සිසුන්ට ඇසීමට සලස්වන්න.
- සිසුන් සවන් දුන් පාඨයේ අඩංගු වචන උච්චාරණය කිරීමට සලස්වන්න.

පියවර 2 :
- ශුද්ධ බයිබලයේ ශුද්ධවර ලූක් 3 : 21 - 22 පාඨය සියලු සිසුන්ට ඇසෙන පරිදි ගෞරවාන්විත ව කියවන්න.

**ජේසුස් වහන්සේගේ බෞතිස්ම ස්නාපනය**

තව ද මුළු සෙනඟ බෞතිස්ම ස්නාපනය ලැබූ විට, ජේසුස් වහන්සේත් බෞතිස්ම ස්නාපනය ලබා යාච්ඤා කරමින් සිටිය දී ස්වර්ගය විවර වී ශුද්ධාත්මයාණෝ පරවියකුගේ රූපාකාරයෙන් උන් වහන්සේ කෙරෙහි පහළ වූ සේක. එවිට 'ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝ ය. ඔබ කෙරෙහි ඉතා ප්‍රසන්න වී සිටිමි' යි අහසින් හඬක් නික්මිණි.

- සවන් දුන් පාඨය මෙනෙහි කිරීමට යෝග්‍ය පරිසරය සකසන්න.
- ශුද්ධ ලියවිලි පාඨයෙහි අඩංගු වගන්ති සංයුක්ත තැටියේ හෝ ප්‍රදර්ශනය කළ පෝස්ටරයේ හෝ තිබුණු බව මෙනෙහි කිරීමට සිසුන්ව මෙහෙයවන්න.
- මෙම භාවනාව මඟින් ජොර්දාන් නදියේ බෞතිස්ම සිදුවීම චිත්‍රණය කර ගැනීමට සිසුන්ට සලස්වන්න.

පියවර 3 :
- සූදානම් කරගෙන ඇති බෞතිස්ම ස්නාපන චිත්‍රය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- සිසුන් මනසින් නිරූපණය කළ දේ චිත්‍රය දෙස බලා සංසන්දනාත්මක ව ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථා සලසන්න.
- සිසුන් ප්‍රකාශ කළ වැකි හුනු ලෑල්ලේ පෙළ ගස්වන්න.
- ජේසු සමිඳුන්ගේ දේව පුත්‍ර භාවය ප්‍රකාශිත වූ වැකිය නැවත නැවත තහවුරු කරවන්න.

පියවර 4 : • සිසු කණ්ඩායම්වලට බ්‍රිස්ටල් බෝඩ් බෙදා දෙන්න.

• සූදානම් කරගත් ශ්‍රී වැකිය අඩංගු වචන පත්‍රිකා වර්ණ අනුව කණ්ඩායම්වලට බෙදා දෙන්න.

| | | | | |
|---|---|---|---|---|
| ඔබ | මාගේ | ප්‍රියාදර | පුත්‍රයාණෝ ය. | ඔබ |
| කෙරෙහි | ඉතා | ප්‍රසන්න | වී | සිටිමි. |

• වචන පත්‍රිකා ගළපා වැකිය නිර්මාණය කර බ්‍රිස්ටල් බෝඩ්වල ඇලවීමට සිසුන් යොමු කරන්න.

• කණ්ඩායම්වල නම් අනුව එම පෝස්ටර පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.

පියවර 5 : • පහත ආකාරයට සකස් කරන ලද පැවරුම් පත සම්පූර්ණ කිරීමට සිසුන්ට ලබා දෙන්න.

බැහැපත්කම/කීකරුකම යන වචන නිවැරදි ව යොදා

පැවරුම් පත සම්පූර්ණ කරන්න.

1. බිම වැටුණු යමක් අහුලා දීම. . . . . . . . . . . . .
2. දෙන ලද පැවරුම් සම්පූර්ණ කිරීම. . . . . . . . . . . . .
3. රූපවාහිනිය නවතා යාච්ඤා කිරීම. . . . . . . . . . . . .
4. තමා අතින් වරදක් වූ විට සමාව අයැදීම. . . . . . . . . . . . .
5. පන්තියේ සියලු සිසුන් සමඟ සුහදව සිටීම. . . . . . . . . . . . .

**තක්සේරුව :**

• දේව පුත්‍ර භාවය ප්‍රකාශ වූ වැකිය මතකයෙන් ප්‍රකාශ කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

• බැහැපත්කම, කීකරුකම වැනි ගුණාංග ඇති ව ජීවත් වීම.

## 3.0 තේමාව : මහෝත්තම දෙවි පියාණන් වහන්සේගේ ම දරුවකු වීම.

**නිපුණතාව** : මහෝත්තම දෙවි පියාණන් වහන්සේගේ ම දරුවකු බවට පත් වෙයි.

**ඉගෙනුම් පල** : 3.2 (B)

- බෞතීස්ම ස්නාපනය ලබාගත් ජේසු සමිඳාණෝ පාළුකරයේ මුහුණ දුන් පරීක්ෂා 3 නම් කරති.
- පැමිණෙන පරීක්ෂා ජය ගැනීමට අවශ්‍ය මඟ පෙන්වීම ඉල්ලා කුඩා යාච්ඤාවක් ලියයි.
- පරීක්ෂා ජයගත් ජේසු සමිඳු ගලීල මුහුද අවට තෝරා ගත් ශ්‍රාවකයන් 12 දෙනා නම් කරයි.
- හොඳම මිතුරා/මිතුරිය තුළ දක්නට ලැබෙන විශේෂ ගුණාංග 3ක් නම් කර, ඔහු/ඇය වෙනුවෙන් යාච්ඤාවක් සාදයි.
- 'බාලයන් මා වෙතට එන්න ඉඩ දෙනු' යන ගීතිකාව අවබෝධයෙන් යුක්ත ව රංගනයෙන් ඉදිරිපත් කරයි.
- ශුභාරංචිය තුළ අඩංගු වන ජේසු සමිඳුන් කුඩා දරුවන්ට ආදරය දක් වූ විශේෂ අවස්ථා 2ක් නම් කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- ශුද්ධ බයිබලය
- 'බාලයන් මා වෙතට . . .' ගීතිකාව ලියූ පෝස්ටරය
- කුඩා ළමයින්ට ජේසු සමිඳුන් ආදරය දක්වන පින්තූර
- අලංකාර පැන්සලක්
- අපෝස්තුලුවරුන් දොළොස් දෙනාගේ නම් අඩංගු පත්‍රිකාව
- කිතුනු ගී පොත

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- පෙර සූදානම් කළ සිසුන් මඟින් පහත සඳහන් සිදුවීම ඉදිරිපත් කරන්න.
- පිටරටකින් ගෙනෙන ලද පැන්සලකට ආශා කළ ක්‍රිශාන් එය පැහැර ගැනීමට කරන ප්‍රයත්නයක්.

මිශෙල් : ඕක මගේ

ක්‍රිෂාන් : නෑ මගේ

මිශෙල් : මේක මගේ තාත්තා උපන් දිනයට ගෙනත් දුන්නේ

ක්‍රිෂාන් : නෑ. මේ මගේ මාමා මට දුන්නේ.

පන්ති භාර ගුරුවරයා : පැන්සල අතට ගෙන එහි සලකුණු බලා ඒ පිළිබඳ ව ප්‍රශ්න ඇසීම

- ප්‍රශ්න ඇසීම මඟින් එය විසඳීමට උත්සාහ කිරීම

  පන්ති භාර ගුරුවරයා : මිශෙල් පැන්සල උල් කළේ කොහොම ද ?

  ක්‍රිෂාන් : කටර් එකෙන්

  පන්ති භාර ගුරුවරයා : ක්‍රිෂාන් පැන්සල උල් කළේ කොහොම ද ?

  ක්‍රිෂාන් : පැන්සල උල් කළේ අම්මා

  පන්ති භාර ගුරුවරයා : පැන්සලේ ඇති සලකුණක් කියන්න

- එම පිළිතුර අනුව ගුරුතුමිය නඩුව විසඳීම. මෙම සිද්ධිය ක්‍රිෂාන්ට වූ පරීක්ෂාවක් බව අවබෝධ කිරීම

පියවර 2 : • ශුද්ධවර ලූක් 4 : 1 - 11 සඳහන් පරීක්ෂා තුන කතාන්දර ස්වරූපයෙන් සිසුන් හට ඉදිරිපත් කරන්න.

**ජේසුස් වහන්සේ පරීක්ෂා කරනු ලැබීම**

ජේසුස් වහන්සේ ශුද්ධාත්මානුභාවයෙන් . . .

1. ගල් ගෙඩිය පාන් ගෙඩිය බවට පත් කිරීමට
2. යක්ෂයා ඉදිරියෙහි නමස්කාර කිරීමට
3. දේව මාලිගයේ කොත මුදුනින් පහතට පැනීම

- කතාන්දරයට සවන් දීමෙන් පසු පහත ප්‍රශ්න සිසුන්ගෙන් විමසන්න.
- සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා පහත ආකාරයේ ප්‍රශ්න කිහිපයක් විමසන්න.

1. ජේසු සමිඳුන් පාළුකරයට ගෙන ගියේ කවරෙක්ද ?
2. පාළුකරයේ සිටි දින ගණන කීය ද ?
3. පළමු පරීක්ෂාව කුමක් ද ?
4. දෙ වන පරීක්ෂාව කුමක් ද ?
5. තුන් වන පරීක්ෂාව කුමක් ද ?

- ජයග්‍රහණය කළ කණ්ඩායම සුදුසු ආකාරයට උපස්තම්භනය කරන්න.

පියවර 3 : • ශුද්ධවර ලූක් 6 : 2 - 16 හි සඳහන් අපෝස්තුලුවරුන්ගේ නම් අඩංගු පත්‍රිකාව ප්‍රදර්ශනය කරන්න.

| |
|---|
| පේදුරු, ඇන්ඩෘ, ජාකොබ්, ජුවාම්, පිලිප්, බර්තොලමෙව්, මතෙව්, තෝමස්, අල්පෙවුස්ගේ පුත් ජාකොබ්, තදේවුස්, සීමෙන්, ජුදාස් |

- පත්‍රිකාවේ සඳහන් අපෝස්තුලුවරුන්ගේ නම් ශබ්ද නඟා කිහිප වතාවක් කියවීමට අවස්ථාව දෙන්න.
- ඉහත අපෝස්තුලුවරුන්ගේ නම් අතුරෙන් එක් එක් සිසුන් වඩාත් කැමති අපෝස්තුළුවරුන් තුන් දෙනකු බැගින් නම් කිරීමට යොමු කරන්න.
- සිසුන් වඩාත් කැමති මිතුරකුගේ/මිතුරියකගේ නමක් සඳහන් කර ඔහු/ඇය සතු විශේෂ ගුණාංග 3ක් ලියා දක්වීමට සලස්වන්න.

පියවර 4 : • කුඩා ළමයින්ට ජේසු සමිඳුන්ගේ ආදරය දක්වන පින්තූර ඉදිරිපත් කරන්න.
• 'බාලයන් මා වෙතට එන්න ඉඩ දෙනු' ගීතිකාව අඩංගු පෝස්ටරය ප්‍රදර්ශනය කරන්න.
• එම ගීතිකාව රඟ දක්වමින් ගායනා කිරීමට සිසුන් මෙහෙයවන්න.

**කිතුනු ගී 239**

බාලයන් මා වෙතට
එන්න ඉඩ දෙනුයි
ජේසු කී වදන් මා
මතකයට නැගේ

ජේසු සමිඳු නමට අපේ සිරස නමනවා
ජේසු සමිඳු හදට අපේ හද ඔසවනවා
ජේසු සමිඳු පෙමට අපේ පෙම ද පුදනවා
ජේසු සමිඳු වෙතට අපේ දෙපා නඟනවා

අපේ ගමන ජේසු වෙතට නැත වරදින්නේ
අපේ සිතැඟි ජේසුට ම යි අපි පවසන්නේ
අපේ හඬට ජේසු තුමන් නිති කන් දෙන්නේ
අපේ යැදුම නැත එතුමන් ඉවත ද මන්නේ

කිතුනු ළමා අපේ උරුම නැති කරන්නෙපා
කිතුනු ළමා අපේ පැතුම් බොඳ කරන්නෙපා
කිතුනු ළමා අපේ සෙතට විත කරන්නෙපා
කිතුනු ළමා අපව මුළාවේ හෙළන්නෙපා

• ජේසු සමිඳුන් කුඩා දරුවන්ට විශේෂිත ව ආදරය දැක්වූ අවස්ථා සිසුන්ට ප්‍රකාශ කරන්න.

ශුද්ධවර ලූක් 18 : 15 - 17

**ළදරුවන්ට ආශීර්වාද කිරීම**

සමහරු උන් වහන්සේගේ අත්, ඔවුන් පිට තබවා ගනු පිණිස තම ළදරුවන් පවා උන් වහන්සේ වෙත ගෙනාවෝ ය. ශ්‍රාවකයෝ ඒ දැක ඔවුන්ට තරවටු කළහ. එහෙත් ජේසුස් වහන්සේ ඔවුන් තමන් වෙත කැඳවා, ළදරුවන්ට මා වෙත එන්නට ඉඩ දෙන්න . . .

**තක්සේරුව :**

• හොඳ ම මිතුරා/මිතුරිය උදෙසා යාච්ඤා කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

• පරීක්ෂාවට නොවැටී සිටීමට අවදි ව යාච්ඤා කරයි.

## 4.0 තේමාව : උත්තරීතර ජේසුස් වහන්සේගේ සුවිශේෂ ගුණාංග

**නිපුණතාව** : උත්තරීතර ජේසුස් වහන්සේගේ සුවිශේෂ ගුණාංග නම් කරයි.

**ඉගෙනුම් පල** : 4.1

- උත්තරීතර ජේසුස් වහන්සේ රෝගීන්ට සුවය දුන් අවස්ථා නම් කරයි.
- ආබාධිත නිවාසවල සේවය කරන අය මඟින් මතු වන ජේසුස් වහන්සේගේ සුවිශේෂ ගුණාංග චිත්‍රයට නඟයි.
- උපන් දිනවල දී හා විශේෂ අවස්ථාවල දී සරණාගතයන් හට අවශ්‍ය දෑ බෙදා දෙයි.
- රෝහල්වල වෙසෙන රෝගීන් හට සත්කාර කළ හැකි අවස්ථා ලියා දක්වයි.
- සරණාගතයන්ට හා රෝහල්වල වෙසෙන අයට අවශ්‍ය දේව ආදරය හා රැකවරණය පතා යාච්ඤාවක් උච්චාරණය කරයි.
- ළමා හා වැඩිහිටි නිවාසවලට ගොස් උත්තරීතර ජේසුස් වහන්සේගේ සුවිශේෂ ගුණාංග ඔවුන්ට ප්‍රකාශ කළ හැකි ක්‍රම 2ක් නම් කරයි.
- ළමා හා වැඩිහිටි නිවාසවල වෙසෙන අය සතුටු කළ හැකි ගීතිකාවක් ගායනා කරයි.

**ඉගෙනුම් සම්පත්** :
- කිතුනු ගී පොත
- ශුද්ධ බයිබලය
- වියළි ආහාර වර්ග, දත් බෙහෙත්, සබන්

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :
- පෙර දැනුම් දුන් පරිදි අසරණයන්, රෝගීන් සමඟ බෙදා ගැනීමට රැගෙන ආ සියල්ල එක්රැස් කරන්න.
- ළඟ ම පිහිටි ආබාධිත/මහලු/ළමා නිවාසයකට හෝ රෝහලකට හෝ අසරණයන් හට හෝ ඒ සියල්ල සිසුන් මඟින් බෙදා දෙන්න.
- උත්තරීතර ජේසුස් වහන්සේ මෙන් අන් අය සමඟ බෙදා ගනිමින් ජීවත් වීමේ වැදගත්කම සාකච්ඡා කරන්න.

පියවර 2 :
- පහත සඳහන් ගීතිකාව ලියා ප්‍රදර්ශනය කර සිසුන් සමඟ ගායනා කරන්න.

**කිතුනු ගී 192**

ජේසුනි ඔබ වේ සුව දෙන්නා
ජේසුනි ඔබ වේ සනසන්නා
ජේසුනි ඔබ වේ ගලවන්නා
ජේසුනි ඔබ වේ දෙවි උතුමා

සමෙරියා ළිඳ ළඟ සිටි ළඳ දැකලා
බොන්නට ඉල්ලුවෙ ඔබ නොවෙ දෝ
ජීවන ජලයෙන් ඈ පුරවාලා
යන්නට හැරියේ ඔබ නොවෙ දෝ

බෙබදු සොයුරා පාරේ වැතිරී
මා දෙස බැලුවේ පිහිට පතා
ඔහු හට සහනය දෙන්නට බැරි වුණෙ
ඔබ හඳුනන්නේ නැති නිසාදෝ

ජෙරිකෝ යන මඟ සිටි අඳ මිනිසා
මොරගා ඉල්ලුවෙ ඔබෙ කරුණා
නෙත් මත අත ලා ඔහු සුව කරලා
යන්නට හැරියේ ඔබ නොවෙදෝ

ජීවිතාලෝකය ලැබුමට කැමති ව
සොයුරා සිටියේ ඇත්ත සොයා
ඔහුගේ කටහඬ ඇසුණේ නෑ මට
ඔබ හඳුනන්නේ නැති නිසා දෝ

සිම්යොන් නිවසෙහි පා ළඟ සිටි කත
අඬමින් ඉල්ලුවෙ පාප කමා
ප්‍රේමය වැඩියෙන් පෙන් වූ ඈ හට
ගැලවුම දුන්නේ ඔබ නොවෙ දෝ

- උත්තරීතර ජේසුස් වහන්සේ රෝගීන් හට සුවය දුන් අවස්ථා කීපයක් ප්‍රකාශ කරන්න.
  - * ශතාධිපතියාගේ සේවකයාට සුවය (ශු. ලූක් 7 : 1-10)
  - * මීමැස්මොර රෝගී ළමයකු සුව කිරීම (ලූක් 9 : 37 - 43)
  - * ලාදුරු රෝගීන් දස දෙනාට සුවය (ශු. ලූක් 17 : 11 - 14)
  - * ජෙරිකෝවේ අන්ධයනට පෙනීම ලබා දීම (ශු. ලූක් 18 : 35 - 43)
- ඉහත සඳහන් අවස්ථා පැහැදිලි කර දී ඒ මඟින් මතු වන උත්තරීතර ජේසුස් වහන්සේගේ ගුණාංග චිත්‍රයට නැඟීමට අවස්ථාව දෙන්න.

පියවර 3 :
- වැඩිහිටි/ළමා නිවාසවල සිටින අසරණ අය සතුටු කළ හැකි ක්‍රියාකාරකම් අඩංගු පෝස්ටරයක් නිර්මාණය කරවන්න.
- ඉහත ක්‍රියාකාරකම්වල නියැළිය හැකි දිනයක් යෝජනා කිරීමට යොමු කරවන්න.

**තක්සේරුව :**

- සරණාගතයන්/ආබාධිත/රෝහල්වල සේවයේ යෙදෙන තිදෙනෙකු නම් කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- උපන්දිනවල දී හා විශේෂ අවස්ථාවල දී අසරණයන් සමඟ බෙදා ගැනීම.

## 4.0 තේමාව : උත්තරීතර ජේසුස් වහන්සේගේ සුවිශේෂ ගුණාංග

**නිපුණතාව** : **උත්තරීතර ජේසුස් වහන්සේගේ සුවිශේෂ ගුණාංග නම් කරයි.**

**ඉගෙනුම් පල** : 4.2 (A)

- ගරු මයිකල් රුද්‍රිගු පියතුමා උත්තරීතර ජේසුස් වහන්සේගේ ගුණාංග ප්‍රදර්ශනය කළ අවස්ථා නම් කරයි.
- ජේසුස් වහන්සේ මෙන් තම ජීවිතය කැප කළ ගරු මයිකල් රුද්‍රිගු පියතුමා ගැන පොත් පිංචක් නිර්මාණය කරයි.
- අසරණ අය වෙනුවෙන් දිවි කැප කළ පියතුමා මෙන් ජීවත් වී ජේසුස් වහන්සේගේ සුවිශේෂ ගුණාංග ලොවට ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය වරම් පතා යාච්ඤාවක් ලියයි.

**ඉගෙනුම් සම්පත්** :

- ගරු මයිකල් රුද්‍රිගු පියතුමාගේ රූපයක්
- ජේසු තුමාගේ හදවතේ කටු ඔටුන්න රුධිරය සහිත රූපයක්
- ශුද්ධ වූ බයිබලය
- කිතුනු ගී පොත
- පොත් පිංචක් සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය
- ගරු මයිකල් රුද්‍රිගු පියතුමාගේ සේවාවන් අඩංගු පෝස්ටරයක්
- නාට්‍ය රඟ දැක්වීමට අවශ්‍ය ඇඳුම්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- නාට්‍ය රඟ දැක්වීමට යෝග්‍ය පරිසරයක් සකස් කරන්න.
- පෙර දැනුම් දුන් පරිදි පියතුමා ලෙස සූදානම් වූ දරුවා ඉදිරියට පැමිණෙන අතර සූදානම් වූ සිසුන් පහත ප්‍රශ්න පියතුමාගෙන් විමසීමට යොමු කරන්න.

මලිත් : ඔබතුමා කවුද ?

පියතුමා : මම තමයි මයිකල් රුද්‍රිගු පියතුමා

නිපුන් : ඔබතුමා කොහේ ද ඉන්නේ ? මොනව ද කරන්නේ ?

පියතුමා : මම ඉන්නේ ඉතා දුෂ්කර ප්‍රදේශයක් වන බුත්තල. මම මීසමේ වැඩ කටයුතු කර, ජේසු ගැන කියා දෙනවා. ඒ විතරක් නෙවෙයි. ඊට පස්සේ මම එහි සිටින දුප්පත් අසරණ මිනිසුන් සමඟ එකතු වී ගොවිතැන් කරනවා.

තරුෂි : මොනව ද ගොවිතැන් කරන්නේ ?

පියතුමා : මම මිනිසුන්ට ප්‍රයෝජනවත් වන ඔසු පැළ වගා කරවීමට ඒ ගොවීන්ට උපකාර කළා. ඒ අයගේ දුක සැප බෙදා ගත්තා.

වරුණි : ඉතින් පියතුමාට ඉන්න ලොකු පල්ලියක් තියෙනවා ද ?

පියතුමා : නෑ. මම ඉන්නේ මැටිවලින් හදා ගත් පුංචි ගෙදරක. ඒ ගෙදර නම 'සුබසෙත් ගෙදර' ඒ පුංචි ගෙදර තමයි මම පූජාව තියන්නෙත්.

පියවර 2 :

- ගරු මයිකල් රුද්‍රිගු පියතුමාගේ පින්තූරය සියලු ම සිසුන්ට පෙනෙන ලෙස ප්‍රදර්ශනය කරන්න.
- සිසු අවධානය පින්තූරය වෙත යොමු කරවන්න. ඔබ රඟ දැක්වූයේ මේ පියතුමාගේ චරිතය බව සිසුන් හට ඒත්තු ගන්වන්න.

- පියතුමාගේ ජීවිතයේ වැදගත් සිදුවීම් හා අවස්ථා සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- සාකච්ඡා කළ කරුණු ඇසුරෙන් පියතුමා ගැන පොත් පිංචක් සෑදීමට සිසුන් යොමු කරන්න.

පියවර 3 :
- 'සූදානම් කරගෙන ඇති ජේසු සමිඳුන්ගේ පින්තූරය ප්‍රදර්ශනය කරන්න.
- ජේසු සමිඳුන් රුධිරය පූජා කළේ මිනිසුන්ගේ පාපය උදෙසා බව පෙර දැනුම නැවත මතක් කර දෙන්න.
- මයිකල් රුද්‍රිගු පියතුමාත් එලෙස ම සිය ජීවිතය පූජාසනය මත පූජා කළ ආකාරය සිසුන් හට දැනෙන ලෙස අවබෝධ කරන්න.
- එම පියතුමා මෙන් ජීවත් වීමට අවශ්‍ය වරම් පතා යාච්ඤාවක් ලිවීමට සිසුන් යොමු කරන්න.

පියවර 4 :
- ශු. බයිබලයේ ජොහන් 13 : 4 - 5 පාඨය සිසුන්ට ඇසෙන ලෙස ශබ්ද නගා ගෞරවාන්විත ව ප්‍රකාශ කරන්න.

### ශු. ජොහන් 13 : 4 5

රාත්‍රි භෝජනයෙන් පසු උන් වහන්සේ නැඟිට තම සළුව ගලවා තබා, තුවායක් ගෙන ඉණ වටා බැඳගත් සේක. ඉන් පසු උන් වහන්සේ භාජනයකට වතුර වත් කොට, ශ්‍රාවකයන්ගේ පාද සෝදන්නටත්, තමන් ඉණ බැඳගෙන සිටි තුවායෙන් පිස දමන්නටත් පටන් ගත් සේක.

- ඉහත පාඨය සිසුන්ට අවබෝධ කර දී එහි අඩංගු පණිවිඩය සිසුන්ගෙන් විමසන්න.
- පහත ගීතිකාව සිසුන් සමඟ අවබෝධයෙන් හා බැතියෙන් ගායනා කරන්න.

### කිතුනු ගී 167

අප ගැන මඳකුත් නොතකා
කැප වී ඔබ සඳහා
ගෙවනට අප දිවි සමිඳේ
අප සිත් පහදන්නේ

අප හට ඔබ සමිඳේ නෑ මැනැලා දුන්නේ
ගැනැ ගැනැ නෑ දෙන්නේ සේවය ඔබට අපේ
තුවාල ගැන නොසිතා අප දිවි පවා පුදා
සේවයෙ යෙදෙමු නොබා කුරුසේ හෙවණ ලබා

නිවාඩුවක් නොසොයා සැප පහසුව දුරලා
අප මුළු දිවිද යොදා කරමුව වැඩ'ප බෙදා
මහන්සියක් නොබලා පිළිලබයක් නොපතා
කොතෙකුත් වැඩ කැරලා හෙම්බත් උණත් හොඳා

ඔබගේ ආසාවේ හැටියට අප සේවේ
කළ බව දැනුණොත් ඒ ඇති අප සිත් සැනහේ
ඔබ මගෙ අත අල්ලා ගෙනැ යනු මට මඟ පා
ඔබගේ සුරතෙ බලේ දෙනු අප හට සමිඳේ

- සූදානම් කරගෙන ඇති පෝස්ටරයේ අඩංගු ගරු මයිකල් රුද්‍රිගු පියතුමාගේ විශේෂ සේවාවන් පැහැදිලි කරන්න.

**තක්සේරුව :**

- ගරු මයිකල් රුද්‍රිගු පියතුමාගේ ජීවිතයේ අපට ගත හැකි ආදර්ශ දෙකක් ප්‍රකාශ කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- හැකි හැම අවස්ථාවක දී ම අන් අයට සරණ වීම

## 4.0 තේමාව : උත්තරීතර ජේසුස් වහන්සේගේ සුවිශේෂ ගුණාංග

**නිපුණතාව** : **උත්තරීතර ජේසුස් වහන්සේගේ සුවිශේෂ ගුණාංග නම් කරයි.**

**ඉගෙනුම් පල** : 4.2 (B)

- ගරු අදිරියන් ජෝශප් පියතුමාගේ සුවිශේෂ දක්ෂතා පිළිබඳ ව කතා කරයි.
- ගරු අදිරියන් ජෝශප් පියතුමාගේ සේවය පිළිබඳ තොරතුරු රැස් කරයි.
- ගරු අදිරියන් ජෝශප් පියතුමා විසින් රචිත ගීතිකා පොත් පිළිබඳ කරුණු ඉදිරිපත් කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- පියතුමාගේ සේවා අඩංගු පෝස්ටරයක්
- පියතුමා විසින් රචිත ගීතිකා අඩංගු පත්‍රිකා
- ජේසු සමිඳුන් සේවයේ යෙදෙන පින්තූරයක්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- පියතුමාගේ පින්තූරය සිසුන් හට ප්‍රදර්ශනය කරන්න.
- පින්තූරය පෙන්වා සිසු අවධානය යොමු කරගෙන ගරු අදිරියන් ජෝශප් පියතුමා හොඳ ගීත රචකයෙක් හා සංගීතඥයෙක් බව පහත කරුණු ද එක් කර ගනිමින් සිසුන් හට කියා දෙන්න.

  * දෙමළ සිංහල ද්විභාෂා මඟින් දිව්‍ය පූජාව අර්ථවත් කර ගැනීමට යෝග්‍ය ගීතිකා නිර්මාණය කළ බව
  * හදේ වීණා නමැති ගීතිකා පොත සිංහල භාෂාවෙන් නිර්මාණය කළ අතර දෙමළ භාෂාවෙන් 'ඉදියවීනෛ' ගීතිකා පොත නිර්මාණය කළ බව
  * එතුමා විසින් රචිත නත්තල් බැති ගී ඉතාමත් ජනප්‍රිය වූ බව
  * පිළිතුරු ගීය සඳහා ගායනා කරන ගීතාවලියේ අඩංගු ගීතිකාවලට තනු නිර්මාණය කර දිව්‍ය පූජාව සාර්ථක කර ගැනීමට දායක වී ඇති බව

පියවර 2 :

- ජේසු සමිඳුන් ජනතාවට සේවය කළ පින්තූරය පෙන්වා එම සේවාවන් කිහිපයක් ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- එලෙසම මෙතුමා ද තම සේවය දේව ජනතාවට දේව රාජ්‍ය උදා කිරීම පිණිස ක්‍රියා කළ ආකාරය සිසුන්ට පැහැදිළි කරන්න.
- තම හැකියා කුසලතා දේව සේවය සඳහා කැප කිරීමට අවැසි වරම් පතා යාච්ඤාවක් ලිවීමට අවශ්‍ය උපදෙස් දෙන්න.

පියවර 3 :

- පහත සඳහන් ගීතිකාව අවබෝධයෙන් සහ බැතියෙන් ගායනා කරවීම සඳහා අත් පත්‍රිකා සිසුන් හට ලබා දෙන්න.

පුන ගැයුම : ජේසුනි නිමල හදයෙනි පරම ප්‍රේම සයුරෙනි
පෙමට බැතිනි පෙම් පුදා අපි ඔබ හද සනසමු

1. අමිල ලෙයිනි නිමල වූ
   පවෙනි ගැලුනු දන සැමා
   පව්නි මුදන ලෙස දනා

2. පබල කරනු ලොව දනා
   බැතිනි රැගෙන සනසවා
   වඳිමු දුක ද ඔබ සනහා

3. හදෙහි වගුල සලිලෙනී
   නිවෙස සැදූ මෙ හද ඔබේ
   දෙස ද රැස ද සැම මෙලෝ

(හදේ වීනා - අංක 14)

**තක්සේරුව :**

- ගරු අදිරියන් ජෝශප් පියතුමාගෙන් අපට ගත හැකි ආදර්ශ දෙකක් නම් කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- හැකි සැම අවස්ථාවකදී ම මිතුරන් හට උදවු උපකාර කිරීම.

# 5.0 තේමාව : ශුද්ධ බයිබලය හා සාන්තුවරයන්ගේ චරිත

**නිපුණතාව** : ශුද්ධ බයිබලය හා සාන්තුවරයන්ගේ චරිත හඳුනාගනියි.

**ඉගෙනුම් පල** : 5.1 (A)

- ළමා බයිබලයේ අඩංගු ආදි පිතෘ ආබ්‍රහම් තුමාගේ සුවිශේෂ ලක්‍ෂණ නම් කරයි.
- ආබ්‍රහම් තුමා දෙවි පියාට කීකරු වූ සුවිශේෂ අවස්ථා රඟ දක්වයි.
- ආබ්‍රහම් තුමාට දෙවි පියාණන් වහන්සේ දුන් පොරොන්දු ලියා දක්වයි.
- ජාකොබ් තුමාට දෙවි පියාණන් වහන්සේ දර්ශනය වූ අවස්ථාව චිත්‍රයට නඟයි.
- ආබ්‍රහම්, ඊසාක්, ජාකොබ් නැමැති ආදි පියවරුන් අපට දායාද කළ දෙවි පියාණන් වහන්සේ ගෙන් විශ්වාසය හා කීකරුකම ඉල්ලා යාච්ඤාවක් උච්චාරණය කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- ළමා බයිබලය
- ශුද්ධ බයිබලය
- නාට්‍ය රඟ දැක්වීමට අවශ්‍ය ඇඳුම්
- දෙවි පියාණන් වහන්සේ ආබ්‍රහම්ට දුන් පොරොන්දු අඩංගු පෝස්ටරය
- වගුව අඩංගු පැවරුම් පත්

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**පියවර 1 :**

- නාට්‍ය රඟ දැක්වීම සඳහා යෝග්‍ය පරිසරයකට සිසුන් රැගෙන යන්න.
- පෙර පවරා දුන් චරිත අනුව එම චරිත නිරූපණයට අවස්ථා සලසන්න.
- ආදි පියවරුන්ගේ චරිත අඩංගු නාට්‍ය රඟ දැක්වීමෙන් පහත සඳහන් කරුණු ඉස්මතු කරන්න.
  1. පොතේ ගුරා මඟින් විශ්වාසයේ ජීවිතයක් ගත කළ ආදි පියවරුන්ගේ චරිත පිළිබඳ අවබෝධ කරවන්න.
  2. ආබ්‍රහම්, ඊසාක් රැගෙන මොරියා දේශයට ගොස් දේව අණට කීකරු වූ බව පසක් කරන්න.
  3. ජාකොබ් සහ ඊසාක්ගේ චරිතවල අඩංගු සුවිශේෂ ගුණාංග සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

**පියවර 2 :**

- ළමා බයිබලය ඇසුරෙන් රඟ දක්වන ලද චරිත සංසන්දනය කිරීමට අවස්ථා සලසන්න.
- සූදානම් කර ගෙන ඇති පැවරුම් පත් බෙදා දෙන්න.
- එම චරිතවලින් ඉස්මතු වන විශේෂ ගුණාංග අඩංගු වගුව සම්පූර්ණ කරවන්න.

| ආදි පියවරු | අපට ගත හැකි ආදර්ශ |
|---|---|
| ආබ්‍රහම් | |
| ඊසාක් | |
| ජාකොබ් | |

පියවර 3 : • ජාකොබ් දුටු සිහිනය උත්පත්ති 28 : 10 - 17 පාඨය ගෞරවාන්විත ව කියවන්න.

### ජාකොබ් දුටු සිහිනය

ජාකොබ් බෙයර් ෂෙබායෙන් නික්ම හාරාන් බලා ගියේ ය. ඔහු එක්තරා ස්ථානයකට පැමිණ ඉර බැස ගිය හෙයින්, මුළු රාත්‍රිය ම එහි ගත කළේ ය. තව ද ඔහු එතැනින් ගලක් රැගෙන, එය මත හිස තබාගෙන නිදන්නට විය. එවිට ඔහු සිහිනයක් දිටීය. පුදුමයකි ! පොළොවෙහි තබන ලද ඉණිමඟකි. එහි මුදුන අහස දක්වා විය. මෙන්න, දෙවියන් වහන්සේගේ දූතයෝ එහි නගිමින් ද, බසිමින් ද සිටියෝ ය. සමිඳාණන් වහන්සේ එයට ඉහළින් සිට, 'මම වනාහි නුඹේ පියා වූ ආබ්‍රහම්ගේ දෙවියන් වහන්සේ ද ඊසාක්ගේ දෙවියන් වහන්සේ ද වන සමිඳාණන් වහන්සේ වෙමි. නුඹ සැතපී සිටින . . .

- ඉහත පාඨය සිසුන්ට අවබෝධ කරවන්න.
- එම අදහස චිත්‍රයට නැඟීමට සිසුන් යොමු කරන්න.

පියවර 4 :
- දෙවි පියාණන් වහන්සේ ආබ්‍රහම්ට දුන් පොරොන්දු අඩංගු පෝස්ටරය ප්‍රදර්ශනය කරන්න.
- පෝස්ටරයේ අඩංගු පොරොන්දු සිසුන්ට ශබ්ද නඟා කියවීමට අවස්ථාව දෙන්න.
- ආදි පියවරුන් තිදෙනාගෙන් වඩාත් සිත් ගත් ආදි පියවරයා පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- ආදි පියවරුන් තුළ තිබූ ගුණාංග වන විශ්වාසය, කීකරුකම කුඩා අප තුළත් ඇති කර ගැනීමට අවශ්‍ය වරම් පතා කුඩා යාච්ඤාවක් උච්චාරණය කිරීමට යොමු කරන්න.

**තක්සේරුව :**

- ආබ්‍රහම් තුමාට දෙවි පියාණන් වහන්සේ දුන් පොරොන්දු ලියයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- විශ්වාසයේ ජීවිතයක් ගත කිරීම

## 5.0 තේමාව : ශුද්ධ බයිබලය හා සාන්තුවරයන්ගේ චරිත

**නිපුණතාව** : ශුද්ධ බයිබලය හා සාන්තුවරයන්ගේ චරිත හඳුනා ගනියි.

**ඉගෙනුම් පල** : 5.1 (B)

- ජාකොබ්ගේ පුත්‍ර වූ ජෝශප් සතු වූ සුවිශේෂ දක්ෂතා ප්‍රකාශ කරයි.
- දෙවි පියාණන් වහන්සේට අවනත වෙමින් තම කරදර අභියෝගවලට මුහුණ දුන් ජෝශප් තුමාගේ චරිතය පිළිබඳ රචනාවක් ලියයි.
- 'තම සහෝදරයන්ට සමාව දුන් ජෝශප්' යන මාතෘකාවට උචිත ලෙස රඟ දක්වයි.
- ඔබට හිරිහැර කරන අය උදෙසා සමාව දීමට අවශ්‍ය වරම් පතා දෙවි පියාණන් වහන්සේට යාච්ඤාවක් ලියා දක්වයි.

**ඉගෙනුම් සම්පත්** :

- ළමා බයිබලය
- රඟ දැක්වීමට අවශ්‍ය ඇඳුම්
- ගීතය අඩංගු පෝස්ටරය
- සකස් කරන ලද පැවරුම් පත්
- වැකිය ලියන ලද පෝස්ටරය
- ජෝශප්ගේ කථාව අඩංගු පොත් පිංච

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :
- ගීතය අඩංගු පෝස්ටරය සියලු දෙනාට ම පෙනෙන ලෙස ප්‍රදර්ශනය කරන්න.
- සුදුසු තාලයකට ගීතය සිසුන් සමඟ ගායනා කරන්න.

ආදිපිය ජාකොබ් හට
පුතුන් දොළහක් හිටියා
කුඩා පුතු ජෝසොප් හා
පියා ස්නේහෙන් බැඳුණා

සහෝදරයන් ජෝසොප්ගේ
හිත් වෛරයෙන් පෙළුණා
මරා දමුමට සිතුවත්
මිසර දේශයට ගෙන ගියා

නිති දේව ප්‍රේමෙන්
ජෝසොප් දිවිය ගෙවුවා
පැමිණි දුක් පීඩා
සතුටින් බාර ගත්තා

අපිත් ජෝසොප් වගේ
පිරෙමින් දේව ආදරෙන්
දේව දරුවෝ වෙමු
ලොවට පෙන්වා අගේ

- අවසානයේ නිර්මාණය කරන ලද නැව ඉහළින් කතෝලික ධජය රඳවන්න.

පියවර 2 : • පෙර ගායනා කරන ලද ගීතයේ ජෝසප්ගේ චරිතය අඩංගු බව සිසුන්ට අවබෝධ කර දෙන්න.

• පින්තූර/චිත්‍ර කතා පොත ඇසුරෙන් ජෝසප්ගේ චරිතය සිසුන්ට පහදන්න.

පියවර 3 : • සිසුන් හට පහත පැවරුම් පත බෙදා දෙන්න.

| නිවැරදි පිළිතුර තෝරා යා කරන්න. | |
|---|---|
| * ජෝශප්ගේ පියා | * සිහින තේරීම |
| * ජෝශප්ගේ දක්ෂතාව | * ජාකොබ් |
| * රජ වාසලේ සෙන්පති | * සමාව දීම |
| * ජෝශප් සතු විශේෂ ගුණාංග | * පොතිපර් |

• පැවරුම් පතෙහි දෙපස ගැළපෙන ලෙස යා කිරීමට සිසුන් යොමු කරන්න.

පියවර 4 : • පහත වැකිය ලියන ලද පෝස්ටරය රැගත් දරුවකු ඉදිරියට ගෙන්වන්න.

තම සහෝදරයන්ට සමාව දුන් ජෝශප්

• ඉහත මාතෘකාවට අනුව ක්ෂණික රඟ දැක්වීමකට සිසුන්ට අවස්ථාව සලසන්න.

• ඉහත ක්‍රියාකාරකම කේවල හෝ කණ්ඩායම් හෝ ලෙස රඟ දැක්වීමට අවශ්‍ය පහසුකම් සලසන්න.

**තක්සේරුව :**

• ජෝශප් තුමා පිළිබඳ වැකි කිහිපයක් ලියයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

• තමාට හිරිහැර කරන අය උදෙසා යාච්ඤා කිරීම.

## 5.0 තේමාව : ශුද්ධ බයිබලය හා සාන්තුවරයන්ගේ චරිත

**නිපුණතාව** : ශුද්ධ බයිබලය හා සාන්තුවරයන්ගේ චරිත හඳුනා ගනියි.

**ඉගෙනුම් පල** : 5.2 (A)

- අසරණ සරණ දූතිකාව ශුද්ධවන්ත භාවයට එසවීමට හේතු වූ කරුණු ලියා දක්වයි.
- තෙරේසා මවුතුමියගේ චරිතය අඩංගු පොත් පිංචක් නිර්මාණය කරයි.
- ශු. තෙරේසා මවුතුමියගෙන් අපට ගත හැකි ආදර්ශ කණ්ඩායම් වශයෙන් ලියා දක්වයි.
- ශු. තෙරේසා මවුතුමිය විසින් අරඹන ලද නිකායන් මඟින් කරන සේවාවන් ලැයිස්තුගත කරයි.
- තෙරේසා මවුතුමිය මෙන් සේවය අවශ්‍ය අය හඳුනා ගෙන ඒ අය වෙත ආදරය දක්වීමට අවශ්‍ය වරම් පතා යාච්ඤාවක් උච්චාරණය කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- තෙරේසා මවුතුමියගේ පින්තූර (ළමා, තරුණ, පැවිදි හා එතුමිය ලංකාවට පැමිණි අවස්ථාව)
- පොත් පිංචක් සැදීමට අවශ්‍ය ද්‍රව්‍ය
- තෙරේසා මවුතුමිය විසින් අරඹන ලද සේවා ස්ථාන අඩංගු පින්තූර
- ශුද්ධ බයිබලය
- කිතුනු ගී පොත
- තෙරේසා මවුතුමියගේ දයාවේ සේවාවන් අඩංගු වර්ණවත් පෝස්ටරයක්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :
- ශුද්ධ බයිබලයේ ශු ලූක් 13 : 10 - 13 පාඨය ගෞරවාන්විත ව කියවන්න.

උන් වහන්සේ සබත් දිනක එක් ධර්මශාලාවක අනුශාසනා කරමින් සිටි සේක. එහි දස අට වසක් තිස්සේ අශුද්ධාත්මයක් නිසා දුර්වලකමින් පෙළුණු, කොයි අන්දමකින් වත් කෙළින් වෙන්නට බැරි ස්ත්‍රියක් වූවාය. ජේසුස් වහන්සේ ඈ දැක කැඳවා 'ස්ත්‍රිය ඔබේ දුර්වලකමින් ඔබ මිදුණෙහිය'යි කියා ඈ පිට අත් තැබූ සේක. එ කෙණෙහි ම ඈ කෙළින් සිට, දෙවියන් වහන්සේට ප්‍රශංසා කළාය.

- පහත ගීතිකාව ලියා ප්‍රදර්ශනය කරන්න.

**කිතුනු ගී 164**

අල්ප වුනට කරන සේවෙ
සුළු වුවත් මට කළේ

කුසගිනින් පෙළුණෙමි අහර බොදුන් ඔබ දුනී
එන්න මගේ පියාණගේ නිවස තුළට දැන්

පිපාසයෙන් තැවුණෙමි පැනින් විතක් ඔබ දුනී
එන්න මගේ පියාණගේ නිවස තුළට දැන්

ගෙයක් නැතිව ළතවුණේ ඔබයි සෙවණ සැපයුවේ
එන්න මගේ පියාණගේ නිවස තුළට දූන්

අදිනු නොලැබ සැඟවුණි වතින් කඩක් ඔබ දූනී
එන්න මගේ පියාණගේ නිවස තුළට දූන්

ලෙඩින් දුකින් පසුවෙමි සහය වන්නෙ ඔබ බැවින්
එන්න මගේ පියාණගේ නිවස තුළට දූන්

- සිසුන් සමඟ ගීතිකාව අවබෝධයෙන් ගායනා කරන්න.
- තෙරේසා මවුතුමියගේ ළමා, තරුණ, පැවිදි පින්තූර ප්‍රදර්ශනය කර එම පින්තූරවලට අදාළ සිදුවීම් සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

පියවර 2 :
- තෙරේසා මවුතුමිය විසින් ආරම්භ කරන ලද දයාවේ දූතිකාවන්ගේ නිකායයේ සුවිශේෂ ගුණාංග සිසුන්ට පැහැදිලි කරන්න.
- ශ්‍රී ලංකාවට පැමිණ ආරම්භ කරන ලද එම නිකායේ සේවා ස්ථාන මෝදර, මොරටුව වැනි හඳුන්වා දෙන්න.
- තෙරේසා මවුතුමිය ලංකාවට පැමිණි පින්තූරය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- එතුමිය අප රටට පැමිණීම භාග්‍යයක් බව අවබෝධ කර දෙමින් දෙව් පියාණන්ට තුති පුදන්න.

පියවර 3 :
- අසරණ සරණ දූතිකාව, ශුද්ධවන්ත භාවයට එසවීමට හේතු වූ කරුණු අඩංගු පෝස්ටරය ප්‍රදර්ශනය කරන්න.
- සිසුන් කණ්ඩායම් කර තෙරේසා මවුතුමියගේ ජීවිතයෙන් ගත හැකි ආදර්ශ ලියා දැක්වීමට අවස්ථාව සලසන්න.

පියවර 4 :
- පවුල තුළ, නිවස අවට, පන්ති කාමරය තුළ තම සේවය ලබා
- එම අය පිළිවෙළින් නම් කරන්න.
- පුංචි දරුවන් ලෙස ඔවුන්ට කළ හැකි සේවා ක්‍රියාත්මක කිරීමට පසුබිම සකසන්න.
- සියලු දෙනා ඒක රාශි වී අසරණ අය උදෙසා යාච්ඤා කරන්න. මෙහි දී ශු. තෙරේසා මවුතුමියගේ මැදහත්කම පතන්න.

**තක්සේරුව :**

- ශු. තෙරේසා මවුතුමියගේ චරිතය අඩංගු පොත් පිංචක් නිර්මාණය කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- හැකි හැම අවස්ථාවක දී ම අසරණ අයට සරණය වීම.

## 5.0 තේමාව : ශුද්ධ බයිබලය හා සාන්තුවරයන්ගේ චරිත

**නිපුණතාව** : **ශුද්ධ බයිබලය හා සාන්තුවරයන්ගේ චරිත හඳුනා ගනියි.**

**ඉගෙනුම් පල** : 5.2 (B)

- අප රටේ සාන්තුවරයා වන ශු. ජුසේ වාස් මුනිතුමා විශ්වාසය ආරක්ෂා කිරීමට ගත් ක්‍රියාමාර්ග ලියා දක්වයි.
- ශු. ජුසේ වාස් මුනිතුමාට කැපකළ දේවස්ථාන ඇති ප්‍රදේශ නම් කරයි.
- ශු. ජුසේ වාස් මුනිතුමා සිදු කළ ප්‍රාතිහාර්යය ඉදිරියට පැමිණ ප්‍රකාශ කරයි.
- 'වන්දනීය වූ පූජනීය වූ' ගීතිකාව සාමූහික ව ගායනා කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- ශු. ජුසේ වාස් මුනිතුමාගේ ජීවිත කථාව අඩංගු සංයුක්ත තැටිය
- ශු. ජුසේ වාස් මුනිතුමාගේ ගීතිකාව අඩංගු පෝස්ටරය
- ශු. ජුසේ වාස් මුනිතුමාගේ විවිධ සේවාවන් හා සිදු කළ ප්‍රාතිහාර්යයන් අඩංගු පෝස්ටරය
- ශු. ජුසේ වාස් මුනිතුමාගේ ගමන් මාර්ගය අඩංගු ලංකා සිතියම
- බැබළෙන තරු පොත
- ශු. ජුසේ වාස් මුනිතුමාට කැප කරන ලද දේවස්ථාන අඩංගු පෝස්ටරය
- කිතුනු ගී පොත

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- ශු. ජුසේ වාස් මුනිතුමාගේ ගීතිකාව ලියන ලද පෝස්ටරය ප්‍රදර්ශනය කරන්න.
- සිසුන් සමඟ බැතියෙන් ගීතිකාව ගායනා කරන්න.
- යෝග්‍ය පින්තූර සමඟින් එම ගීතිකාවේ අරුත සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

**කිතුනු ගී 460**

ශුද්ධවන්ත වූ පූජනීය වූ
ජුසේ වාස් ධම්ම දූත පුදුදුරාණනේ
ධීර වීර වූ ඔබේ
දහම් සේවයේ අනුහසින්
මෙ ලක්බිම අපේ එළිය වේ

විපත් වළේ වැටී පෙළී සිටියවුන් සොයා
එදා ගියේ ඔබයි පියේ නොබා රෑ දිවා
දහම් සිසිල පොවා ඔවුන් පවස නිවා
නවෝදයක් උදා කළේ මහා පිනක් ලබා //

කැලෑ මැදින් දෙපා වැරෙන් ගියේ දුර ගමන්
දුගී වෙසින් සැදී ගතින් දරා දැඩි ගිමන්
කුසට අහර පවා නැති වැ දවස ගෙවා
එදා දෙසූ දහම් අමා රසේ බසී ගලා //

මිනිස් සිතුම් පැතුම් ලොවී සැපට නැඹුරු වී
මිලේ නිලේ බලේ කෙරේ සිටින වහල් වී
දනන් කෙලෙස් නසා දෙලෝ සැපත් දිනා
දෙවන් වරම් කිතුන් දහම් රකින්න පෙම් පුදා //

පියවර 2 :
- ශු. ජුසේ වාස් මුනිතුමාගේ ජීවිත කතාව අඩංගු සංයුක්ත තැටිය ප්‍රදර්ශනය කරන්න හෝ බැබළෙන තරු පොතින් එතුමාගේ කතාව කථාන්දර ස්වරූපයෙන් විස්තර කරන්න.
- සිසුන් කණ්ඩායම් කර ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහනක් දියත් කරන්න.
- ඒ සඳහා ශු. ජුසේ වාස් මුනි චරිතයේ වැදගත් සිදුවීම් විමර්ශනයට ලක් කරන්න.
- ජය පරාජයට මුහුණ දීමේ ශක්තිය සිසුන් තුළ වර්ධනය කරන්න.

පියවර 3 :
- ශු. ජුසේ වාස් මුනිතුමාගේ ගමන් මාර්ගය අඩංගු ශ්‍රී ලංකා සිතියම ප්‍රදර්ශනය කරන්න.
- ශු. ජුසේ වාස් මුනිතුමා ගමන් කළ මාර්ගයේ තිබූ දුෂ්කරතා හා ජයගත් අභියෝග සිසුන් හට පහදන්න.
- විවිධ දුෂ්කරතා මැද ශු. ජුසේ වාස් මුනිතුමා කළ සේවාව පෝස්ටරය ප්‍රදර්ශනය කරමින් පහදන්න.

| |
|---|
| * ධර්මය ප්‍රචාරය කිරීම. |
| * ලන්දේසීන් ඉදිරියේ නොපෙනී යාම. |
| * වෙස් වළාගෙන දුෂ්කර ගම්මාන තුළ කිතුනු සංඝ පිහිටුවීම. |
| * එම කිතුනු සංඝ නිතර බැහැදකිමින් දේව වන්දනා පිළිවෙත් ඉටු කිරීම. |
| * තනි ඇතා මෙල්ල කිරීම. |
| * වර්ෂාව ලබා දීම. |
| * දූදුරු ඔයෙන් එතෙර වීම. |
| * වසූරිය, වසංගත රෝගීන්ට උපස්ථාන කිරීම. |

- ඉහත පෝස්ටරයේ සඳහන් පරිදි ශු. ජුසේ වාස් මුනිතුමාගේ සේවාවන් හා ප්‍රාතිහාර්යය වෙන වෙන ම ලැයිස්තුගත කිරීමට සිසු කණ්ඩායම් මෙහෙයවන්න.

පියවර 4 :
- ශු. ජුසේ වාස් මුනිතුමාට කැප කළ දේවස්ථාන අඩංගු පෝස්ටරය ප්‍රදර්ශනය කරන්න.
- එම දේවස්ථාන ඇති ප්‍රදේශ දෙකක් නම් කිරීමට සිසුන් යොමු කරන්න.
- අප රටේ සාන්තුවරයා වන ශු. ජුසේ වාස් පියතුමා ශුද්ධවරයට එසවීම පිළිබඳ සිසුන් දැනුම්වත් කරන්න.

**තක්සේරුව :**

- ශු. ජුසේ වාස් මුනිතුමා විශ්වාසය ආරක්ෂා කිරීමට ගත් පියවර 2ක් නම් කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- ශු. ජුසේ වාස් මුනිතුමා මෙන් අන් අයට ජේසු සමිඳුන් ගැන කියා දීම.

## 5.0 තේමාව : ශුද්ධ බයිබලය හා සාන්තුවරයන්ගේ චරිත

**නිපුණතාව** : ශුද්ධ බයිබලය හා සාන්තුවරයන්ගේ චරිත හඳුනා ගනියි.

**ඉගෙනුම් පල** : 5.2 (C)

- දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වෙනුවෙන් ජීවිතය පූජා කළ සාන්තුවර චරිතය කතාන්දර ස්වරූපයෙන් ඉදිරිපත් කරයි.
- දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ආරක්ෂා කිරීමට ශු. තාර්සිසියුස් තුමා ගත් පියවර කිහිපයක් නම් කරයි.
- පළමු වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබන දරුවන්ගේ නාම සාන්තුවරයා නම් කරයි.
- ලබන වසරේ දී දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමට සූදානමක් වශයෙන් ආත්මීක මල් පොකුරක් සාදයි.
- 'අදහමි දිව්‍ය සත්ප්‍රසාදෙනි' ගීතිකාව ගෞවරයෙන් යුක්ත ව ගායනා කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- බැබළෙන තරු පොත
- ගීතිකාව අඩංගු පත්‍රිකා
- ශු. තාර්සියුස් තුමාගේ පින්තූරයක්
- ශු. බයිබලය
- දිව්‍ය සත්ප්‍රසාද වහන්සේගේ කරඬුව අඩංගු පින්තූරයක්
- ආත්මීක මල් පොකුරක් සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය
- යාච්ඤාව අඩංගු පත්‍රිකා පෝස්ටරයක්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- හැකි නම් සියලු සිසුන් දේවස්ථානයට ගෙන ගොස් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ඉදිරියේ ගෞරවාන්විත ව පෙළ ගස්වන්න.
- නැතිනම් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේගේ කරඬුව අඩංගු පින්තූරය ප්‍රදර්ශනය කරන්න.
- ජීවමාන ජේසුස් වහන්සේගේ වැඩ සිටීම පිළිබඳ විශ්වාසය තහවුරු වන ආකාරයකට කරුණු ඉදිරිපත් කර, ශු. බයිබලය ශුද්ධවර ලූක් 22 : 19 - 20 දක්වා පාඨය ගෞරවාන්විත ව කියවන්න.
- ගීතිකාව අඩංගු පත්‍රිකාව සිසුන්ට බෙදා දෙන්න.
- ඉතා ම බැතියෙන්, ගෞරවයෙන්, අර්ථාන්විත ව ගීතිකාව සිසුන් සමඟ ගායනා කරන්න.

පුන ගැයුම : අදහමි දිව්‍ය සත්ප්‍රසාදෙනි
බැතියෙන් සමරමි ස්වර්ග රන් නිධානෙනි
ජීවත් කරමි මගේ ජීවිතෙන්
ජේසු ක්‍රිස්තු සමිඳු දිව්‍ය සත්ප්‍රසාදෙනි

ස්වර්ග අසිරි සිරිය ඔබයි දිව්‍ය සත්ප්‍රසාදෙනී
පරම අමිල වරම ඔබ යි සුරම්‍ය සුර විමානෙනි
සන්තෘප්ත වී ඒ අසිරියෙන් //
පාප සාප දුරු කරන්න අසිරියක් වෙමින්

ස්වර්ගයෙන් සැපත් වූ අමිල බොදුන ඔබයි සමිඳුනි
බොදුන බුදින සුදන කිසිම දිනක නොදනි කුසගිනි
සන්තෘප්ත වී ඒ භොජනෙන් //
දුගී පැළක ඉදෙන බතක රහස මම වෙමි

ගොල්ගොතාවේ කුරුස කන්දෙ ගැලුව රුධිරෙ ජේසුනී
රැගෙන බොන්න රාත්‍රි භෝජනනේ දී දුන්නු පාත්‍රෙනී
සන්තෘප්ත වී ඒ රුධිරයෙන් //
පවස නිවන දිය දෝතක රහස මම වෙමී

වික්‍රමාන්විතෙන් ම අසුන් අණ බැටළු පොව්වෙනි
අමිල ස්වර්ග දෝත මරි මවුන් ද ශුද්ධවන්තෙනී
සන්තෘප්ත වී ඒ නිමේෂයෙන් //
ස්වර්ග මිහිර දන්ම විඳිමු සත්ප්‍රසාදයෙන්

පියවර 2 :

- දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබන ළමයින්ගේ අරක්ගත් මුනිවරයා වන ශු. තාර්සීසියස් මුනිතුමාගේ පින්තූරය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- පහත සඳහන් කරුණු කතාන්දර ස්වරූපයෙන් සිසුන් හට අවබෝධ කර දෙන්න.
  * ක්‍රි.ව. 258 දී පමණ රෝමයේ පීඩන කාලයේ දී ජීවත් වූ තරුණ කිතුනුවෙකි.
  * ඔහුගේ දෙමාපියෝ ජීවතුන් අතර නොවූහ.
  * එහෙත් ඔහුගේ මව ඔහුට ප්‍රකාශ කර තිබුණේ 'මම මෝක්ෂයේ සිට ඔබ එනතුරු බලා සිටිමි' කියා ය.
  * එවකට සිටි මැක්සිමියන් වැලේරියානු පාලකයා ආගමය මුළුමනින් ම විනාශ කර දැමීමට කටයුතු කළේ. එහෙත් කිතුනු භේවායකු එවකට සිටි දෙවන සික්ස්ටස් පාප්තුමාට ප්‍රකාශ කළේ මරණීය දණ්ඩනයට නියම ව සිටි කිතුනුවන්ට රහසින් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා දීමේ වැදගත්කම ය.
  * එම අවශ්‍යතාව සපුරාලීමට ඉදිරිපත් වූ කුඩා තාර්සීසියුස් තුමා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ සඟවා ගෙන සිරගත වූවන් වෙත රැගෙන යාමට පියවර තැබී ය.
  * ක්‍රීඩාවේ නියැළුණු සමවයස් පිරිමි ළමයින්ට තාර්සීසියුස් තුමා මුණ ගැසුණේ ය. එවිට ඔවුන් සමඟ ක්‍රීඩා කිරීමට එතුමාට බල කළේ ය.
  * ක්‍රීඩා කිරීමට වඩා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ රැගෙන යාමේ වගකීම ඉටු කළ එතුමාට ඔවුන් ගල් ගැසී ය.
  * එම මොහොතේ කිතුනු භේවායා පැමිණ තුවාල වී සිටි තාර්සීසියුස් තුමා අමතමින් පහත් හඬින් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ඉල්ලා සිටියේ ය.
  * මරණාසන්න ව සිටි හෙතෙම ජේසු සමිඳුන් තම හදවතට තුරුලු කර ගනිමින් ස්වර්ගස්ථ විය.

පියවර 3 :

- ඉහත කතාව කණ්ඩායම් වශයෙන් රඟ දැක්වීමට සිසුන්ට අවස්ථාව සම්පාදනය කරන්න.
- ශු. තාර්සිසියුස් තුමා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ආරක්ෂා කිරීමට පියවර ගත්තේ කෙසේ ද යන්න ලියා දැක්වීමට එම කණ්ඩායම්වලට ම අවස්ථාව සම්පාදනය කරන්න.

පියවර 4 : • පහත සඳහන් ආත්මික මල් පොකුර සෑදීමට අවශ්‍ය උපදෙස් දෙන්න.
  * සහභාගි වූ දිව්‍ය පූජා වාර ගණන
  * පවුල් ජපමාලය උච්චාරණය
  * මර්දන ක්‍රියා (සිදු කළ ක්‍රියාව සඳහන් කළ යුතු ය.)
  * හොඳ වැඩ
- ඉහත සඳහන් කරුණු ඔස්සේ නිර්මාණශීලී ව ආත්මික මල් පොකුරක් සෑදීමට සිසුන් යොමු කරන්න.
- සියලු ම නිර්මාණ ඇගයීමට ලක් කරන්න.
- සෑදූ ආත්මික මල් පොකුරු වර්ෂ අවසානයේ පවත්වන දිව්‍ය පූජාවේ දී ඔප්පු කිරීමට සිසුන් මෙහෙයවන්න.

**තක්සේරුව :**

- පළමු වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබන දරුවන්ගේ නාම සාන්තුවරයා නම් කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- සෑම විටෙක දී ම ජීවමානව වැඩ සිටින දිව්‍ය සත්ප්‍රසාද වහන්සේව ගෞරවයෙන් බැහැදැකීම.

# කතෝලික ධර්මය තක්සේරු කිරීමේ පත්‍රිකාව

| | | | | | සිසුන් ගේ නම<br><br>තක්සේරු කිරීමේ පරිමාණ<br>සාර්ථක ව කරයි<br>දුෂ්කරතා පෙන්නුම් කරයි<br>තවදුරටත් උදවු අවශ්‍ය ය. • |
|---|---|---|---|---|---|
| | | | | | 1. නව වසරේ ලද සියලු දේ ලස්සණට පිරිසිදු ව තබා ගැනීමට කළ යුතු දේ ප්‍රකාශ කරයි. |
| | | | | | 2. මහෝත්තම දෙවි පියාණන් වහන්සේගේ මැවිල්ල ආරක්ෂා කිරීමට පුංචි ළමයින් වශයෙන් කළ හැකි දේවල් ලැයිස්තුගත කරයි. |
| | | | | | 3. දේව සමානකමට මවන ලද මිනිසා සතු යහපත් ගුණාංග ලියා දක්වයි. |
| | | | | | 4. එදිනෙදා සිදුවන වැරදිවලට කමාව ඉල්ලා යාච්ඤා කරයි. |
| | | | | | 5. සහයෝගයෙන් හා අවනත ව කටයුතු කළ ආකාරය චිත්‍රයට නගයි. |
| | | | | | 6. පාසලේ දී හා අසල්වාසීන් සමඟ මිතුදම් ගොඩනඟා ගන්නා ආකාරය ප්‍රකාශ කරයි. |
| | | | | | 7. මහලු, රෝගී, අසරණ හා මහලු අය වෙනුවෙන් යාච්ඤා කරයි. |
| | | | | | 8. පන්ති කාමරය හා පාසල අවට පිරිසිදු කිරීමට දායක වෙයි. |
| | | | | | 9. දෙවි පියාණන් වහන්සේට කමා කළ හැකි සෑම අවස්ථාවක් ම නම් කරයි. |
| | | | | | 10. පවුලේ ජපමාලය උච්චාරණය කිරීම සඳහා නිවසේ පරිසරය සූදානම් කිරීමට අවශ්‍ය දේ ලැයිස්තුගත කරයි. |
| | | | | | 11. පාද නමස්කාරයේ ස්ථාන හතක් නම් කරයි. |
| | | | | | 12. ශ්‍රී ලංකාවේ ණය මංගල්‍ය දින දෙකක් නම් කරයි. |
| | | | | | 13. ශුද්ධ වූ ත්‍රිත්වය නම් කරයි. |
| | | | | | 14. දේව දරුවකු ලෙස ජීවත් වීමට අවශ්‍ය වරම් පතා යාච්ඤාවක් ලියා බිත්ති පුවත්පතේ ප්‍රදර්ශනය කරයි. |
| | | | | | 15. දේව පුත්‍ර භාවය ප්‍රකාශ වූ වැකිය මතකයෙන් ප්‍රකාශ කරයි. |
| | | | | | 16. හොඳම මිතුරා/මිතුරිය උදෙසා යාච්ඤා කරයි. |
| | | | | | 17. සරණාගතයන්/ආබාධිත අය/රෝහල්වල සේවයේ යෙදෙන තිදෙනෙකු නම් කරයි. |
| | | | | | 18. ගරු මයිකල් රුද්‍රිගු පියතුමාගේ ජීවිතයෙන් ගත හැකි ආදර්ශ දෙකක් ප්‍රකාශ කරයි. |
| | | | | | 19. ගරු අදිරියන් ජෝශප් පියතුමගෙන් අපට ගත හැකි ආදර්ශ දෙකක් නම් කරයි. |
| | | | | | 20. ආබ්‍රහම් තුමාට දෙවි පියාණන් වහන්සේ දුන් පොරොන්දු ලියයි. |
| | | | | | 21. ජෝශප් තුමා පිළිබඳ වැකි කිහිපයක් ලියයි. |
| | | | | | 22. ශු තෙරේසා මවුතුමියගේ චරිතය සම්බන්ධ කුඩා පොත් පිංචක් නිර්මාණය කරයි. |
| | | | | | 23. ශු. ජුසේ වාස් මුනිතුමා විශ්වාසය ආරක්ෂා කිරීමට ගත් පියවර දෙකක් නම් කරයි. |
| | | | | | 24. පළමු වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබන දරුවන්ගේ නාම සාන්තුවරයා නම් කරයි. |